| Erasing library identification stamps and removing slip and back covers | 87 | 85 | 15 | 15 |
| Interchanging book slip of previously loaned book with stolen book | 68 | 67 | 34 | 33 |

In table 08 respondents have mentioned escaping with materials at library closure hour when there is a rush, hiding stolen/ mutilated materials in folders and erasing library identification stamps and removing slip and back covers as the most common methods of stealing and mutilation. More than 70% of students have responded to above methods for stealing and mutilation.

Table 09: Collection protection strategies

| Collection protection strategies | Agree No. | % | DisagreeNo. | % |
|---|---|---|---|---|
| User education or awareness seminars | 87 | 85 | 15 | 15 |
| Library must constantly display mutilated books with names of the readers | 59 | 58 | 43 | 42 |
| Encourage users to protect the collection | 71 | 70 | 31 | 30 |
| Develop the collection ownership attitudes | 76 | 75 | 26 | 25 |
| Installation of security cameras | 66 | 65 | 36 | 35 |
| Provide electronic resources | 82 | 80 | 20 | 20 |
| Fine system according to the damage | 51 | 50 | 51 | 50 |

According to the table 09 more than 80% have agreed to the statements given in the table.85% students indicated that user education or awareness seminars and 80% indicated that provide electronic resources.75% students agreed to develop the collection ownership attitudes and also 70% students mention and agreed to encourage users to protect the collection.

Table :10 Suggestions to protect the library materials

| Suggestions to protect the library materials | Agree No. | % | DisagreeNo. | % |
|---|---|---|---|---|
| Improve supervision | 83 | 81 | 19 | 19 |
| Conduct regular library programmes | 74 | 73 | 28 | 27 |
| Provide enough library materials | 76 | 75 | 26 | 25 |
| Digitalization of rare materials | 71 | 70 | 31 | 30 |
| Regular supervision of users | 81 | 79 | 21 | 21 |
| Improve competence in security officers | 53 | 52 | 49 | 48 |
| Books should be examined after return or used by the reader | 58 | 57 | 44 | 43 |
| Introduce huge fine system for abusers | 63 | 62 | 39 | 38 |
| Ban bringing blades, correction fluid, water bottles, file covers. etc to the library | 42 | 41 | 60 | 59 |
| Introduce electronic checking system | 68 | 67 | 34 | 33 |
| Provide cheaper and efficient photocopy services | 88 | 86 | 14 | 14 |
| Through search at exits | 46 | 45 | 56 | 55 |

According to the table 10, 86% students agreed to provide cheaper and efficient photocopy service. 81% said to improve supervision, 79% agreed about regular supervision of users, 75% said to provide enough library materials and 73% agreed about conducting regular library programmers.

## RECOMMENDATION

The following recommendations are hereby given based on these identified problems.

- Proper orientation should be given to users. First year orientation should be well planned with video documentary with demonstration to the students
- Multiple copies of books in the circulation section and those displayed in the open stack should be provided since it is discovered that textbooks are the most affected by theft and mutilation.
- User registration number should be mentioned on the date label below the return date, when issuing a book. It will give an idea about the list of users who borrowed the particular library materials.
- Affected libraries should launch campaign against user delinquency, there should be posters containing warning against theft and mutilation being conspicuously pasted on the notice boards within and outside the library.
- Libraries should be in possession of a standby and efficient power generating set to provide electricity to the library services during power shortage. The period of temporary electricity blackout usually encourages library delinquency among users.
- Libraries should engage more trained security personnel.
- Strict implementation of reasonable circulation policies must be adhered to by all libraries to control and avoid library theft and mutilation.
- The photocopy services of the library should be subsidized. This will reduce the tendency of stealing or mutilating library materials.
- In service training should be encouraged by libraries, particularly for the junior staff on what library profession is all about. This will enhance the efficiency of the workers.

## CONCLUSION

The study was mainly concerned with examination of the abuse of library materials in the Sri Lank Law College library, Sri Lanka: perception of the first year, second year and final year students. There is no doubt that for as library materials are physically handled and intellectually explored, there is bound to be some forms of abuse or the other. The results of the study have clearly indicated that the documents of the Sri Lanka Law College library network is considerably abused by the users. Tearing away pages, writing notes inside text books, highlighting/underlining the pages, hiding books are common. Abuse of print library materials are higher than the non print materials, because print materials are used more often than the non print materials. The library awareness programme is a very important factor to the users. Students who undergo frequent library instruction and orientation understand better the value of borrowing and returning library materials, and avoid abusing them. Introducing CCTV camera system is another alternative to reduce the abuse of library materials. Library should invest in more electronic resources which will reduce to a large extent the incidence of users physically handling documentary materials. The students have proposed that the library staff also should be carefully involved with the protection of the collection. The library staffs who work in the shelf and the reading rooms should frequently visit and observe these areas. Books should be examined by the counter staff when they are returned by the user. Library staff should be made aware of the value, importance, rareness of library materials, should introduce motivational and punishable guidelines for library staff requiring the responsibility of the collection, not issuing already damaged books, getting the assistance of security staff, employees placed in the stack areas, counter for supervision of the readers. Staff should be carefully examined when books are returned. Conducting awareness programmes to make the students understand the importance of protecting library materials. Inculcating proper attitudes will help them to refrain from abusing library materials.

## REFERENCES

Aguolu, C. C., and Aguolu, I. E. (2002). Libraries and information management in Nigeria. Ed-Linform services" Maiduguri'

Holt, G. E. (2007). Theft by library staff. The bottom line: managing library finances, 20 (2), p'85-92.

Karin de Jager, J. S. (2004). Public relation for public libraries' The Wilson Company" New York.

Teferra, B. (1996). Security management of collection in Ethiopian academic libraries. African Journal of libraries Archives and Information Science, 6 (2), p'121-128

# User Perception and Satisfaction Regarding the Information Services Provided by the National Library of Sri Lanka

**Anuradha Dassanayake**

*Assistant Director, National Library & Docuemntatuiion Services Board, Sri Lanka*
*anuradhamssc2013@gmail.com*

## ABSTRACT

In yester era various types of material used for writing purposes and store the knowledge .The Knowledge based society is a very essential fact for national development. Sri Lanka has a long history of writing and literary activities with historical recodes and archival evidence. Buddhist texts were systematically documented on Ola leaf at Matale Aluvihare in Sri Lanka. Publication history in Sri Lanka was traced back to Portuguese era. Also the first printing press was established in Sri Lanka by Dutch in 1734. There are so many Information methods to communicate the knowledge. Among them published book is the main source of communication method. Books are filled with Knowledge, parable, insights to a happy life, helpful topics about life, love, fear, child rearing, prayer, worship and helpful advices. And Publication of books serves as a particularly important parameter of the Knowledge field. This research was conducted to investigate the status of publication level of subject, publisher's contribution to publish books, publication pattern, and language barriers for knowledge dissemination and to investigate lack of publication, and to identify which kinds of books were published during the period of last five years. Survey method was used for this study as the main research tool. Statistics were used as data collection instrument. Data obtained were analyzed using a data table. Data were collected from National Bibliography in Sri Lanka from 2013 to 2017, and used Dewey decimal classification system for classifying the knowledge. A finding of the study shows that authors have published more books in Literature & rhetoric subject field. As the data indicates most of the books are published in Sinhala Language and English, Tamil books are less. It was revealed that Godage was the highest contributor in publishing books in Sri Lanka. Most of the Authors eager in publishing their books by themselves. And suggest to increase the publish in books in other subject disciplines. The Government of Sri Lanka should give financial support to authors to publish their publication and resources for publishers that will support the future competitiveness of the book publishing industry. This research was limited only to printed books.

**Key words:** Publication, Dissemination of knowledge, Information, Publisher

# ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයෙන් සපයන තොරතුරු සේවාවන් සම්බන්ධයෙන් පාඨක සංජානනය අධ්‍යයනය කිරීම

## හැඳින්වීම

අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය (IFLA)හි දක්වා ඇති පරිදි ජාතික පුස්තකාලය යනු විශේෂ වගකීම් රාශියකින් සමන්විත පුස්තකාල විශේෂයකි. බොහෝ විට මෙය අර්ථ දක්වා ඇත්තේ ජාතියක් සතු පුස්තකාලයක් සහ තොරතුරු පද්ධතියක් ලෙස ය. මෙම වගකීම රටින් රටට වෙනස් වන නමුත් සෑම රටකම ජාතික පුස්තකාලයක් පොදුවේ එම රටේ මුද්‍රණයේ පවතින (මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික) ප්‍රකාශන නෛතික තැන්පතු හරහා එකතු කිරීම සහ ලැයිස්තු ගත කිරීම, එම ප්‍රකාශන සංරක්ෂණය කර මතු අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කරලීම, සෘජුවම හෝ වෙනත් පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන හරහා පරිශීලකයන්ට සේවා සැපයීම (විමර්ශන සේවා සැපයීම, ග්‍රන්ථනාමාවලී සම්පාදනය, පුස්තකාල සම්පත් සංරක්ෂණය, අන්තර් පුස්තකාල පිරුළු සේවාවන් සැපයීම), ජාතික සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම, තම රට සම්බන්ධයෙන් විද්ශීය රටවල ප්‍රකාශයට පත්කර ඇති විදේශීය ප්‍රකාශන අත්පත් කර ගැනීම, ජාතික සංස්කෘතික ප්‍රතිපත්තිය ප්‍රවර්ධනය කිරීම හා ජාතික සාක්ෂරතා ව්‍යාපාරවලට නායකත්වය ලබා දීම සිදුකරනු ලබයි. එසේම ජාතික පුස්තකාලය බොහෝ විට ජාත්‍යන්තර වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා ජාතික සංසදයක් ලෙස තම සේවය සපයයි.

යුනෙස්කෝ ආයතනය (UNESCO) අර්ථ දක්වන පරිදි ජාතික පුස්තකාලයක වගකීම වන්නේ රටතුළ ප්‍රකාශයට පත්වන සියලු වැදගත් ප්‍රකාශනවල පිටපත් ලබා ගැනීම හා ඒවා සංරක්ෂණය කිරීමත් නීතිමය හෝ වෙනත් විධිවිධාන යටතේ තැන්පතු පුස්තකාලයක් ලෙස ක්‍රියාකිරීමත්ය. එසේම, පහත සඳහන් ක්‍රියාකාරකම් ජාතික පුස්තකාලයක් මගින් ඉටුවිය යුතුය.

- ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය කිරීම
- තම රට පිළිබඳව පළවන විදේශීය ප්‍රකාශන අත්පත් කර ගැනීම හා යාවත්කාලීනව පුස්තකාල එකතුව පවත්වාගෙන යාම.
- ජාතික ග්‍රන්ථ නාමාවලියෙහි කේන්ද්‍රීය තොරතුරු මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කිරීම
- ඒකාබද්ධ සුචිය සම්පාදනය හා පවත්වාගෙන යාම
- පූර්වකාලීන ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ප්‍රධාන වශයෙන් පර්යේෂණ හා විමර්ශන පුස්තකාලයක් වන අතර එය ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානය වේ. ජාතික පුස්තකාලය හරහා සියලුම ශ්‍රී ලාංකිකයන්ට පුස්තකාල සම්පත් මෙන්ම තොරතුරු සැපයීම කරනු ලබයි.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයෙන් සපයනු ලබන තොරතුරු සේවාවන් ප්‍රධාන වශයෙන් පාඨක සේවා අංශය හා බැඳී පවතී. පාඨක සේවා අංශයේ ප්‍රධාන කර්තව්‍ය වනුයේ දේශීය

හා විදේශීය සියලුම පාඨකයන්ගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීම වේ. ඒ අනුව ඔවුන්ට අවශ්‍ය විමර්ශන සේවා සැපයීම, යොමුගත සේවා, අන්තර් පුස්තකාල පිරුළු සේවා සැපයීම, පර්යේෂකයන් උදෙසා ප්‍රවර්තන සම්ප්‍රජාන සේවා (CAS), වරණීය විඥාපන සේවා (SDI) සැපයීම, තොරතුරු ප්‍රති ඇසුරුම්කරණ සේවා, ජායා පිටපත් හා ස්කෑනින් සේවා, විද්‍යුත් දත්ත පදනම් ගවේෂණය, පුස්තකාල සූචිය වෙත මාර්ගගත ප්‍රවේශය (OPAC), ක්ෂණික විමර්ශන සේවා සැපයීම, අන්තර්ජාල පහසුකම් සැපයීම, ඩිජිටල් පුස්තකාල සම්පත් ගවේෂණය ආදී තොරතුරු සේවා රැසක් පාඨක සේවා අංශය හරහා ක්‍රියාත්මක වේ.

## අරමුණු

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයෙන් සපයනු ලබන තොරතුරු සේවාවන් කෙරෙහි පාඨක සංජානනය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම වේ. මෙම අධ්‍යයනයේ සෙසු අරමුණු පහත පරිදි වේ.

- ජාතික පුස්තකාලය භාවිතයේ උපයෝජක අරමුණු මොනවාද යන්න ගවේෂණය කිරීම
- ජාතික පුස්තකාලයේ සම්පත් එකතුවේ ස්වභාවය පිළිබඳ පාඨක ප්‍රතිචාර අධ්‍යයනය කිරීම
- ජාතික පුස්තකාලයේ තොරතුරු සේවා සැපයීමේ දී කාර්යමණ්ඩලයේ ස්වභාවය පිළිබඳ උපයෝජක ප්‍රතිචාර අධ්‍යයනය කිරීම

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා සමීක්ෂණ ක්‍රමවේදය යොදා ගත් අතර ප්‍රාථමික දත්ත ලබාගැනීම සඳහා ව්‍යුහගත ප්‍රශ්නාවලියක් යොදාගන්නා ලදී. මෙම අධ්‍යයනයේ සංගහනය ලෙස ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය භාවිත කරනු ලබන පාඨකයින් යොදා ගත් අතර එහි දී ජාතික පුස්තකාලයේ සාමාජිකත්ව වර්ගීකරණය අනුව ත්‍රෛයිමාසික, වාර්ෂික, යාවජීව යන සාමාජිකත්වයන් ලැබූ පාඨක පිරිසක් යොදා ගන්නා ලදී. නියැදිය වශයෙන් පාඨකයන් 200 දෙනෙකු යොදාගත් අතර එයින් 150 දෙනෙකුගේ ප්‍රශ්නාවලී අධ්‍යයනය කර ලබා ගන්නා ලද දත්ත ප්‍රමාණාත්මක හා ගුණාත්මක ලෙස විශ්ලේෂණය කරන ලදී. වගු සටහන් ප්‍රස්ථාර ආශ්‍රයෙන් දත්ත ඉදිරිපත් කිරීම සිදු කර තිබේ.

## ප්‍රතිචාරිකයින්ගේ ප්‍රජා විද්‍යාත්මක තොරතුරු

අධ්‍යයනය සඳහා සහභාගී කරගන්නා ලද නියැදිය සතුව පැවති ප්‍රජා විද්‍යාත්මක ව්‍යාප්තිය කෙරෙහි අවධානය යොමු කිරීමේ දී ප්‍රතිචාර දැක්වූවන්ගේ ස්ත්‍රී පුරුෂභාවය, වයස් කාණ්ඩය හා අධ්‍යාපන මට්ටම යන කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදි.

වගු අංක 01 : ස්ත්‍රී පුරුෂභාවය අනුව පාඨකයින්ගේ ව්‍යාප්තිය

| විචල්‍ය | ප්‍රතිචාර සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| ස්ත්‍රී | 78 | 52 |
| පුරුෂ | 72 | 48 |
| එකතුව | 150 | 100 |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත

වගු අංක 01 අනුව අධ්‍යනය සඳහා ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 52% ක් ස්ත්‍රී වන අතර 48%ක් පුරුෂ වශයෙන් ව්‍යාප්තව පවති.

වගු අංක 02 : වයස් කාණ්ඩ අනුව ව්‍යාප්තිය

| වයස්කාණ්ඩය (අවුරුදු) | ප්‍රතිචාර සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| 20 ට අඩු | 8 | 5 |
| 20-29 | 55 | 36 |
| 30-39 | 34 | 23 |
| 40-49 | 18 | 12 |
| 50-59 | 20 | 14 |
| 60ටවැඩි | 15 | 10 |
| එකතුව | 150 | 100 |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත

වගු අංක 02 ට අනුව ජාතික පුස්තකාලය භාවිත කරනු ලබන පාඨකයන්ගෙන් බහුතරයක් වයස අවු. 20 - 24 (36%ක්) වයස් කාණ්ඩය නියෝජනය කරන අතර 34 පාඨක ප්‍රමාණයක් (23%) වයස අවු. 30-39 වයස් කාණ්ඩයට අයත් වේ. මේ අනුව පැහැදිලි වන්නේ තොරතුරු ලබාගත් කාලසීමාවන්ට අදාලව බහුතර පාඨක ප්‍රමාණය වයස අවු. 20-31 අතර තරුණ වයස් කාණ්ඩයට අයත් බවයි.

ප්‍රස්තාර අංක 01: අධ්‍යාපන මට්ටම අනුව පාඨක ව්‍යාප්තිය




මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත

මෙම අධ්‍යයනයට සහභාගි වූ පාඨකයන්ගේ අධ්‍යාපන මට්ටම පිළිබඳව අධ්‍යයනය කරන විට, ජාතික පුස්තකාලය භාවිත කරන බහුතරයක් උසස් අධ්‍යාපන මට්ටමක් ලබාගත් පාඨක පිරිසක් වන අතර ඔවුන් අතරින් අනුපිළිවෙළින් 30%ක් උපාධි අපේක්ෂක පාඨකයින් ද 25% ක් ප්‍රථම උපාධිය සහිත පාඨකයින් ද 14%ක් පශ්චාත් උපාධිය සහිත පාඨකයින් ද වේ.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයෙන් සපයනු ලබන තොරතුරු සේවාවන් පිළිබඳව උපයෝජකයින්ගේ දැනුවත්භාවය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙහි ප්‍රධාන අරමුණ වේ. ඒ අනුව ජාතික පුස්තකාලයේ සාමාජිකත්වය ලබා ගැනීම, ජාතික පුස්තකාලය භාවිතයේ අරමුණු, ජාතික පුස්තකාලයෙන් සපයනු ලබන තොරතුරු සේවාවන්, ජාතික පුස්තකාලයේ කාර්යමණ්ඩලයේ කාර්යක්ෂමතාවය යනාදිය පිළිබඳව අධ්‍යයනය කරන ලදී.

වගු අංක 03 : ජාතික පුස්තකාලයේ සාමාජිකත්වය

| සාමාජිකත්වයේ ස්වභාවය | ප්‍රතිචාර සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| ත්‍රෛමාසික සාමාජිකත්වය | 35 | 24 |
| වාර්ෂික සාමාජිකත්වය | 95 | 63 |
| යාවජීව සාමාජිකත්වය | 20 | 13 |
| එකතුව | 150 | 100 |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත

ප්‍රස්තාර අංක 02: ජාතික පුස්තකාලයේ සාමාජිකත්වය




මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත

අධ්‍යයනය සඳහා සහභාගී වූ පාඨකයින් පුස්තකාල සාමාජිකත්වය ලබාගෙන ඇති අකාරය විමසීමේ දී වාර්ෂික සාමාජිකත්වය ලබා ඇති පාඨක පිරිස 63% ක ප්‍රතිශතයක් ගන්නා අතර ත්‍රෛයිමාසික සාමාජිකත්වය 24%ක් ද යාවජීව සාමාජිකත්වය 13%ක් ද ලබා ගෙන ඇත. ඒ අනුව ජාතික පුස්තකාලයේ වාර්ෂික සාමාජිකත්වය ලබා ගෙන ඇති පාඨක පිරිස ඉහළ ප්‍රමාණයක් ගනී.

## ජාතික පුස්තකාලය භාවිත කිරීමේ අරමුණු

ජාතික පුස්තකාලය භාවිත කරන පාඨකයන්ගෙන් ඔවුන් කුමන අරමුණු උදෙසා ජාතික පුස්තකාලය භාවිත කරන්නේ ද යන්න පිළිබඳව අධ්‍යයනය කරන ලදී.

වගු අංක 04 : ජාතික පුස්තකාලය භාවිත කිරීමේ අරමුණ

| අරමුණු | ප්‍රතිචාර සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| අධ්‍යාපනික කටයුතු සඳහා | 85 | 58 |
| පර්යේෂණ කටයුතු සඳහා | 53 | 35 |
| විනෝදාස්වාදය සඳහා | 8 | 5 |
| විවේකය සඳහා | 4 | 2 |
| එකතුව | 150 | 100 |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත

ඉහත දක්වා ඇති ප්‍රතිචාරයන් දෙස අවධානය යොමු කරන විට පාඨකකයින් 58%ක් අධ්‍යාපනික කටයුතු සඳහා ජාතික පුස්තකාලය භාවිත කරන අතර 35% ක් පර්යේෂණ කටයුතු සඳහා ද ජාතික පුස්තකාලය භාවිත කරනු ලබයි. ඒ අනුව වගු අංක 03 හා ප්‍රස්තාර අංක 02 හි දක්වා ඇති උපයෝජකයන්ගේ අධ්‍යාපන මට්ටම හා සංසන්දනය කරන විට උසස් අධ්‍යාපනය ලැබූ ඉහළ පාඨක පිරිසක් පෙන්නුම් කළ අතර ඔවුන් ජාතික පුස්තකාලය භාවිත කිරීමේ අරමුණ අධ්‍යාපනික කටයුතු හා පර්යේෂණ කටයුතු සඳහා ඉහළ අගයක් පෙන්නුම් කරයි.

## ජාතික පුස්තකාලය මගින් සපයනු ලබන තොරතුරු සේවාවන්

ජාතික පුස්තකාලය පර්යේෂණ හා විමර්ශන පුස්තකාලයක් වශයෙන් ඒ හා සම්බන්ධිත තොරතුරු හා සේවාවන් රැසක් සිය පාඨකයන් වෙත සපයයි. ඒ අතරින්,

1. විමර්ශන සේවා සැපයීම
   i. විමර්ශන එකතුවේ ගුණාත්මකභාවය (Quality of the Reference Service)
2. පර්යේෂකයන් සඳහා තොරතුරු සේවා සැපයීම
   I. වරණීය විඥාපන සේවය (Selective Dissemination of Information)
   II. ප්‍රවර්තන සම්ප්‍රජාන සේවය (Current Awareness Service)
3. ක්ෂණික විමර්ශන සේවා සැපයීම (Frequently ask questions)
4. තොරතුරු යොමුගත සේවා (Referral Service)

5. අන්තර් පුස්තකාල පිරුළු සේවය (Inter Library Loan Service)
6. ජායා පිටපත් හා විද්‍යුත් පරිලෝකන සේවා සැපයීම (Photocopy & Scanning)
7. පුස්තකාල සූචිය වෙත මාර්ගගත ප්‍රවේශය සැලසීම (OPAC)
8. විද්‍යුත් තොරතුරු මූලාශ්‍ර වෙත ප්‍රවේශය සැලසීම (Electronic Resources Searching)
9. තොරතුරු ප්‍රතිඇසුරුම්කරණ සේවා (Information Repackaging)
10. ඩිජිටල් පුස්තකාල තොරතුරු සම්පත් වෙත ප්‍රවේශය සැලසීම (Digital Library Information Resources Searching)
11. අන්තර්ජාල භාවිතයෙන් තොරතුරු ගවේෂණය (Internet Searching)
12. පුස්තකාල කාර්යමණ්ඩලයේ කාර්යක්ෂමතාවය (Efficiency of Library Staff)
13. පුස්තකාල එකතුවේ විෂය ආවරණය (Areas of the subjects of the library collection)

## විමර්ශන සේවා සැපයීම

විමර්ශන එකතුවේ ගුණාත්මකභාවය හා යාවත්කාලීනත්වය සම්බන්ධයෙන් උපයෝජක අදහස් විමසීමේ දී 38%ක ඉහළ ප්‍රතිශතයක් විමර්ශන එකතුව සම්බන්ධයෙන් තරමක සතුටුදායක බව ප්‍රකාශ කරන අතර 30%ක ප්‍රතිශතයක් සතුටුදායක නොවන මට්ටමේ පවතින බව ප්‍රකාශ කර ඇත. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ප්‍රධාන වශයෙන්ම පර්යේෂණ හා විමර්ශන පුස්තකාලයක් ලෙස ක්‍රියාත්මක වන අතර ඉහත ප්‍රතිචාර අනුව පෙනී යන්නේ ජාතික පුස්තකාලය විසින් තවදුරටත් සංවර්ධනය කර යාවත්කාලීන බවින් යුතු විමර්ශන එකතුවක් සංවිධානය කළ යුතු බවයි.

වගු අංක 05: විමර්ශන එකතුවේ ගුණාත්මකභාව හා යාවත්කාලීනත්වය

| විචල්‍ය | ප්‍රතිචාර සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| ඉතාම සතුටුදායකයි | 5 | 4 |
| සතුටුදායකයි | 33 | 22 |
| තරමක් සතුටුදායකයි | 58 | 38 |
| සතුටුදායක නැත | 45 | 30 |
| කිසිසේත් සතුටුදායක නැත | 9 | 6 |
| එකතුව | 150 | 100 |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත

වගු අංක 06: ක්ෂණික විමර්ශන සේවය

| විචල්‍ය | ප්‍රතිචාර සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| ඉතාම සතුටුදායකයි | 0 | 0 |
| සතුටුදායකයි | 30 | 20 |
| තරමක් සතුටුදායකයි | 28 | 18 |
| සතුටුදායක නැත | 55 | 37 |
| කිසිසේත් සතුටුදායක නැත | 37 | 25 |
| එකතුව | 150 | 100 |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත

ක්ෂණික විමර්ශන සේවය මගින් පුස්තකාල පරිශීලකයන්ට ඇති වන්නා වූ ගැටළු, ප්‍රශ්න සඳහා ක්ෂණිකව පිළිතුරු සැපයීම සිදුකරනු ලබයි. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය මගින් සපයනු ලබන ක්ෂණික විමර්ශන සේවය පිළිබඳව විමසා බැලීමේ දී වගු අංක 09 ට අනුව 37% ක් වැනි ඉහළ ප්‍රතිශතයක් සතුටුදායක නොවන බව ප්‍රකාශ කර ඇත.

වගු අංක 07: පුස්තකාල සුචිය වෙත මාර්ගගත ප්‍රවේශය

| විචල්‍ය | ප්‍රතිචාර සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| ඉතාම සතුටුදායකයි | 3 | 2 |
| සතුටුදායකයි | 25 | 17 |
| තරමක් සතුටුදායකයි | 30 | 20 |
| සතුටුදායක නැත | 78 | 52 |
| කිසිසේත් සතුටුදායක නැත | 14 | 9 |
| එකතුව | 150 | 100 |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත

පුස්තකාල සුචිය වෙත මාර්ගගත ප්‍රවේශය ලබා දීමේ දී ජාතික පුස්තකාල සුචිය වෙත ඍජුව හරහා ප්‍රවේශ වීම පිළිබඳව 52% ක් වැනි ඉහළ පරිශීලක පිරිසක් සතුටුදායක නොවන බව ප්‍රකාශ කර ඇත.

වගු අංක 08 : අන්තර්ජාලය භාවිතයෙන් තොරතුරු ගවේෂණය

| විචල්‍ය | ප්‍රතිචාර සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| ඉතාම සතුටුදායකයි | 12 | 8 |
| සතුටුදායකයි | 14 | 9 |
| තරමක් සතුටුදායකයි | 18 | 12 |
| සතුටුදායක නැත | 62 | 41 |
| කිසිසේත් සතුටුදායක නැත | 46 | 30 |
| එකතුව | 152 | 100 |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත

අන්තර්ජාලය භාවිතයෙන් තොරතුරු මූලාශ්‍ර වෙත ප්‍රවේශය හා තොරතුරු ගවේශනය ද සතුටුදායක මට්ටමක නොපවතී.

වගු අංක 09 : විද්‍යුත් තොරතුරු මූලාශ්‍ර වෙත ප්‍රවේශය

| විචල්‍ය | ප්‍රතිචාර සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| ඉතාම සතුටුදායකයි | 27 | 18 |
| සතුටුදායකයි | 55 | 36 |
| තරමක් සතුටුදායකයි | 30 | 20 |
| සතුටුදායක නැත | 25 | 17 |
| කිසිසේත් සතුටුදායක නැත | 13 | 9 |
| එකතුව | 150 | 100 |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත

ජාතික පුස්තකාලය දැනට විද්‍යුත් තොරතුරු මූලාශ්‍ර ලෙස Library and Information Science Abstract 'LISA &"Law Lanka" DELNET "Developing Library Network&" CILIP (Charted Institute of Library and Information Professional) මේ අධ්‍යයනය සඳහා යොදාගත් අතර එම තොරතුරු වෙත ප්‍රවේශය සැලසීම සම්බන්ධයෙන් 36%ක ඉහළ ප්‍රතිශතයක් සතුටුදායක බව ප්‍රකාශකර ඇත.

වගු අංක 10 : තොරතුරු ප්‍රති ඇසුරුම්කරණ සේවා

| විචල්‍ය | ප්‍රතිචාර සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| ඉතාම සතුටුදායකයි | 20 | 13 |
| සතුටුදායකයි | 60 | 40 |
| තරමක් සතුටුදායකයි | 28 | 19 |
| සතුටුදායක නැත | 19 | 13 |
| කිසිසේත් සතුටුදායක නැත | 23 | 15 |
| එකතුව | 150 | 100 |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත

ජාතික පුස්තකාලය මගින් තොරතුරු ප්‍රතිඇසුරුම්කරණ සේවාවන් ලෙස විවිධ මාතෘකා රැසක් යටතේ පුවත්පත් ලිපි, අන්තර්ජාල තොරතුරු, සඟරා ලිපි ආදිය වෙන වෙනම එක්රැස් කරන තොරතුරු එකතු පවත්වාගෙන යනු ලැබේ. මෙම සේවාවන් පිළිබඳව පාඨක අදහස් විමසීමේ දී සතුටුදායක බව 40%ක ප්‍රතිශතයක් ප්‍රකාශ කර ඇත.

වගු අංක 11: අන්තර් පුස්තකාල පිරුළු සේවය

| විචල්‍ය | ප්‍රතිචාර සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| ඉතාම සතුටුදායකයි | 21 | 14 |
| සතුටුදායකයි | 58 | 39 |
| තරමක් සතුටුදායකයි | 30 | 20 |
| සතුටුදායක නැත | 15 | 10 |
| කිසිසේත් සතුටුදායක නැත | 26 | 17 |
| එකතුව | 150 | 100 |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත

මෙම සේවාව වර්තමානය වන විට මහජන පුස්තකාල, විශ්වවිද්‍යාල පුස්තකාල හා විශේෂ පුස්තකාල මත ක්‍රියාත්මක වන අතර මේ හරහා අත්පිටපත්, වාරසඟරා හා රජයේ ප්‍රකාශන ආදිය ද පාඨකයන්ට ලබා ගැනීමට හැකියාව පවතී. මේ පිළිබඳව දක්වා ඇති ප්‍රතිචාර දෙස බැලීමේ දී පාඨකයන් 58%ක ප්‍රමාණයක් මෙම සේවාව සතුටුදායක බව ප්‍රකාශ කර ඇත.

වගු අංක 12: ජායා පිටපත් හා විද්‍යුත් පරිලෝකන සේවය

| විචල්‍ය | ප්‍රතිචාර සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| ඉතාම සතුටුදායකයි | 10 | 6 |
| සතුටුදායකයි | 30 | 20 |
| තරමක් සතුටුදායකයි | 25 | 17 |
| සතුටුදායක නැත | 67 | 45 |
| කිසිසේත් සතුටුදායක නැත | 18 | 12 |
| එකතුව | 150 | 100 |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත

ජාතික පුස්තකාල පරිශීලකයන්ට ලබාදෙන තවත් තොරතුරු සේවාවක් ලෙස ජායා පිටපත් හා විද්‍යුත් පරිලෝකන සේවාව හඳුන්වා දීමට හැකිය. මෙම සේවාව පිළිබඳ උපයෝජක අදහස් විමසීමේ දී එම සේවාව සතුටුදායක නොවන මට්ටමක පවතින බව 45% ක් ප්‍රකාශ කර ඇත. වගු අංක 13 : පුස්තකාල කාර්යමණ්ඩලයේ කාර්යක්ෂමතාවය

| විචල්‍ය | ප්‍රතිචාර සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| ඉතාම සතුටුදායකයි | 55 | 33 |
| සතුටුදායකයි | 75 | 50 |
| තරමක් සතුටුදායකයි | 12 | 8 |
| සතුටුදායක නැත | 10 | 7 |
| කිසිසේත් සතුටුදායක නැත | 3 | 2 |
| එකතුව | 150 | 100 |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත

පුස්තකාල කාර්යමණ්ඩලයේ කාර්යක්ෂමතාවය පිළිබඳව අධ්‍යයනය කරන විට සමස්තයක් ලෙස 50%ක් සතුටුදායක මට්ටමේ පවතින බව ප්‍රකාශ කර ඇත.

පුස්තකාල එකතුවේ විෂය ආවරණය සතුටුදායක මට්ටමේ පවතින බව 45%ක් ප්‍රකාශ කර ඇති අතර 47%ක් ප්‍රකාශ කර ඇත්තේ විෂය ආවරණය තරමක සතුටුදායක මට්ටමක පවතින බව ය.

## සාරාංශය

ජාතික පුස්තකාලයෙන් සපයනු ලබන තොරතුරු සේවාවන් පිළිබඳව සමස්ත ඇගයීම ඉහත අධ්‍යයනයට ලැබුණු උපයෝජක ප්‍රතිචාර සංක්ෂිප්ත ලෙස පහත පරිදි දැක්විය හැක.

1. උපයෝජක අවශ්‍යතාවන් සැලකීමේ දී විමර්ශන එකතුව සමබර නොවීම. විෂය ආවරණය ගත් විට සිංහල, සාහිත්‍ය කලා යන විෂය ධාරාවන්ට වැඩි ප්‍රමුඛත්වයක් සහිතව එකතුව සංවිධානය වී තිබීම හා විද්‍යා තාක්ෂණික ආදී විෂය ක්ෂේත්‍රයන් හි විෂය ආවරණය ප්‍රමාණවත් නොවීම දැක ගත හැකිය.
2. ජාතික පුස්තකාල සූචිය වෙත මාර්ගගතව ප්‍රවේශවීමේදී ඇති වන යම් යම් අපහසුතාවයන් එනම් ගවේශනය කිරීමේ දී සිදුවන අපහසුතාවයන්, දත්ත ඇතුළත් කිරීමේ දී සමහර දත්තවල ඒකීයත්වයක් නොමැති වීම මත උපයෝජකයන්ට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ අපහසුතාව.
3. අන්තර්ජාල පහසුකම් ප්‍රමාණවත් නොවීම.
4. ඡායා පිටපත් හා විද්‍යුත් පරිලෝකන සේවා සැපයීමේ දී ඒ සඳහා අයකරන ගාස්තු ඉහළ මට්ටමක පැවතීම හා කාලය ගතවීම
5. නව තාක්ෂණික සේවාව /පහසුකම් භාවිතයට අවස්ථාව නොමැති වීම හා සාම්ප්‍රදායික අත්හුරු ක්‍රම (Manual) මත බොහෝ සේවාවන් ක්‍රියාත්මක වීම
6. සමස්තයක් ලෙස කාර්යමණ්ඩලය කාර්යක්ෂමතාවයෙන් යුක්ත වුවත් කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම ඇතැම් තොරතුරු අවශ්‍යතා ඉටුකර ගැනීමේ දී බාධාවකි.

## නිගමන

- ජාතික පුස්තකාලය භාවිත කරන පාඨක ප්‍රමාණයෙන් බහුතරය තරුණ වයස් කාණ්ඩයේ වන අතර බහුතරය ඉහළ අධ්‍යාපන මට්ටමක් සහිත පිරිසක් වේ. ජාතික පුස්තකාලය භාවිතයේ අරමුණු ලෙස වැඩි ප්‍රමාණය අධ්‍යාපනික හා පර්යේෂණ අරමුණු සඳහා ජාතික පුස්තකාලය භාවිත කරනු ලබන බව හඳුනාගත හැකි වේ.
- ජාතික පුස්තකාලයේ විමර්ශන එකතුවේ ගුණාත්මක භාවය, විද්‍යුත් තොරතුරු මූලාශ්‍ර වෙත ප්‍රවේශය, තොරතුරු ප්‍රති ඇසුරුම්කරණ සේවා, අන්තර් පුස්තකාල පිරුළු සේවා, පුස්තකාල කාර්යමණ්ඩලයේ කාර්යක්ෂමතාව, පුස්තකාල එකතුවේ විෂය ආවරණය යන සේවාවන් ගත්විට සමස්තයක් ලෙස උපයෝජක ප්‍රතිචාර සතුටුදායක මට්ටමක පවතී.

- ජාතික පුස්තකාලයෙන් සපයනු ලබන තොරතුරු සේවාවන් අතරින්, ක්ෂණික විමර්ශන සේවය, තොරතුරු යොමුගත සේවය, පුස්තකාල සූචිය වෙත මාර්ගගත ප්‍රවේශය සැළසීම, ඩිජිටල් තොරතුරු මූලාශ්‍ර වෙත ප්‍රවේශය, අන්තර්ජාල භාවිතයෙන් තොරතුරු ගවේශනය, ඡායා පිටපත් හා විද්‍යුත් පරිලෝකන සේවා යන සේවාවන් ගත්විට ඒ සම්බන්ධයෙන් උපයෝජක ප්‍රතිචාර සමස්තයක් ලෙස අසතුටුදායක මට්ටමේ පවතී.

## නිර්දේශ

- ජාතික පුස්තකාලයෙන් විමර්ශන සේවා සැපයීමේ දී විමර්ශන එකතුවේ ගුණාත්මකභාවය හා යාවත්කාලීනත්වය තවදුරටත් වර්ධනය විය යුතුය.
- විමර්ශන එකතුවේ විෂය ආවරණය පුළුල් කිරීමට කටයුතු කළ යුතුය.
- යාවත්කාලීන විමර්ශන මූලාශ්‍ර එකතුවක් පවත්වාගෙන යා යුතුය.
- සාම්ප්‍රදායික තොරතුරු සේවාවලින් බැහැරව නව තාක්ෂණය හා බැඳුනු තොරතුරු සේවා කෙරෙහි යොමුවීම අත්‍යාවශ්‍යය.
- ජාතික පුස්තකාලය තුළ අන්තර්ජාල සේවා සැපයීම සංවර්ධනය කළ යුතු අතර ඒ හා බැඳුනු තොරතුරු ගවේශන පහසුකම් ද වර්ධනය කළ යුතුය.
- ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.
- ඡායා පිටපත් හා විද්‍යුත් පරිලෝකන සේවාව කාර්යක්ෂම හා පාඨක හිතකාමී සේවාවක් බවට පත්කළ යුතුය.
- පුස්තකාල කාර්යමණ්ඩලයට තොරතුරු කුසලතා වර්ධනයට හා තොරතුරු තාක්ෂණ කුසලතා සංවර්ධනයට අවශ්‍ය වෘත්තීය පුහුණුව ලබා දිය යුතුය.
- තොරතුරු තාක්ෂණය හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කළ යුතුය.
- තොරතුරු සේවා ලබා දීමේ දී උපයෝජක තෘප්තිය තවදුරටත් වර්ධනය වන ආකාරයෙන් එම සේවාවන් සැපයීම කෙරෙහි අවශ්‍ය පියවර ගත යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

Ababa,A. (2003) .The value of library services indevelopment' Economic Commission for Africa3' p (16) 1-12

Adeniran, P.(2011). User satisfaction with academic libraries services( Academic staff and

students perspectives' International Journal of Library and Information Science 3(10), p.1

Kumara, J .&Nikam, K. (2012).Perception of young adults towards public library services.

International Journal of Information Dissemination and Technology, 5(2)p.1-4.

Ranganathan, C. (2012) Perception and Expectation of the Users of Bharathidasan University

Library: A Study. India: Department of Library and Information Science" Tamil Nadu'

# A Study on the Use of Piriven Libraries of Sri Lankan Piriven Students for Searching Academic Information: with Special Reference to Western Province Pririven Libraries

**Rev. Bopeththe Somananda thero**

*TemporaryLecturer, Department of Library & Information Science, University of Kelaniya, Sri Lanka*

*somanandabopeththe@gmail.com*

## ABSTRACT

Buddhist temples were the foundations of Sri Lankan old education system. The education of Sri Lanka which commenced at “Kalapprasada Pirivena” in Anuradhapura first, Developed as “Pirivena” subsequently. Piriven Library is the main information center for the Pirivena education process. The Piriven Libraries, which represent the academic libraries, are increasing the knowledge and skills of the students in various subjects and languages, and fulfill the teacher's academic information requirements. Accordingly, the problem of the research was, "Does the students use the Pirivena libraries effectively to explore the information need in order to make their learning process a success?”. The main objective of the study was to identify the use and usage patterns of pirivena library among students and other objectives were identifying the attitudes and problems in relation with the usage of libraries.

The study based on the survey method and population of the study were all pirivena in the western province. Stratified sample method was used to select the sample and consisted 15 piriven libraries. Primary data was collected by distribution of questionnaires under the stratified random sampling system among the respective students. Secondary data was collected through printed sources which were considered relevant to the research. MS excel software was used to analyse the primary data obtained through the questionnaires.

It was revealed that, although there was a large collection in the Pirivena libraries, while a period has been set aside for the use of libraries, most of the students from the sample do not use libraries during their learning process. The students won’t display the liking to the use libraries either and the teacher who is maintaining Pirivene library had Lack of proper understanding of the library and the information services it provides.

Suggestions were made to organize programs that positively influence the students about the importance of library use and by implementing the assessment based educational process by drawing closer the students to the library, these can provide sustainable solutions for these issues. The institutions responsible for the library sector, including the Ministry of Education, the National Library must come forward For that.

**Keywords -** : Piriven Libraries, Academic Library, Information needs, Academic Information

# ශ්‍රී ලංකාවේ පාරිවේණික ශිෂ්‍යයන් සිය ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය තොරතුරු ගවේෂණයේදී පිරිවෙන් පුස්තකාල භාවිතය පිළිබඳ අධ්‍යයනයක් - බස්නාහිර පළාතේ පිරිවෙන් පුස්තකාල ඇසුරෙන්

## හැඳින්වීම

ක්‍රි.පූ. පස්වන සියවසේ භාරතයේ මධ්‍ය දේශයේ පහළ වූ බුදුදහම ක්‍රි.පූ. තෙවන සියවසේ දී මිහිඳු මා හිමියන් විසින් ලංකාවට හඳුන්වාදීම මෙරට ඉතිහාසයේ සිදු වු ඉතා සුවිශේෂීත ම සිදුවීම යි. බුදුසමයේ පහස ලැබීමත් සමග මෙරට ආරම්භ වූ බෞද්ධ අධ්‍යාපන ක්‍රමය ශ්‍රී ලාංකිකයන් ශිෂ්ටවත් ජනවර්ගයක් බවට පත් කිරීමට හේතු වූ මූලික සාධකය විය. බුදු සමයේ සුවිශේෂී ඉගැන්වීම් පදනම් කොට ගෙන බිහිවූ මෙම සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රමය "පිරිවෙන් අධ්‍යාපනය, ආරාමික අධ්‍යාපනය" යන නම්වලින් ව්‍යවහාරිත විය. ක්‍රි.පූ. තෙවන සියවසේ සිට ක්‍රි.පූ. පහළොස් වන සියවසේ අගභාගය දක්වා සියවස් ගණනාවක් පුරාවට මෙරට ප්‍රධාන අධ්‍යාපන ක්‍රියාවලියෙහි ජීවනාලිය වූයේ බෞද්ධ අධ්‍යාපනය පදනම් කොටගත් පිරිවෙන් අධ්‍යාපනය යි. ඒ අනුව පැරණි ඓතිහාසික යුගයේ සිට මෙරට ජාතික අධ්‍යාපනයේ මූලස්ථානය වූයේ පිරිවෙන බැව් පැහැදිලි ය. නමුදු වර්තමානයේ එකී පිරිවෙන් ආයතන ජාතික අධ්‍යාපනයට සමාන්තරව සාම්ප්‍රදායික අධ්‍යාපන ආයතනයක් වශයෙන් පවත්වා ගෙන යනු දැකිය හැකි ය.

මේ අනුව භික්ෂුවගේ වාසස්ථානයක් වශයෙන් පමණක් නොව භික්ෂූන්ගේ අධ්‍යාපනික මධ්‍යස්ථානය වශයෙන් ද පිරිවෙන විහාරයේ ම කොටසක් බවට පත් විය. ඉගෙනීම සහ ඉගැන්වීම යන දෙකම බෞද්ධ භික්ෂු පිළිවෙතට ආවේණික වූ අංගයන් බැවින් පිරිවෙන් ප්‍රමාණය සංඛ්‍යාත්මකව සීඝ්‍ර ලෙස වර්ධනය විය. අධ්‍යාපනය දියුණු නොකර ආගම, කලාව ආදී කිසිවක් දියුණු කළ නොහැකි බැවින් ශ්‍රී ලංකීය ගිහි පැවිදි දෙපිරිසගේ ම අධ්‍යාපනික අවශ්‍යතා ඉටු කරලීම උදෙසා ඈත අතීතයේ සිට ම පිරිවෙන් මුල් වී ක්‍රියා කරන ලදී. මෙසේ විකාශනය වූ පිරිවෙන් නමැති සාම්ප්‍රදායික අධ්‍යාපන ආයතනය ආරම්භ වන්නේ අනුරාධපුර යුගයේ කාලප්‍රසාද පිරිවෙන් විහාරයෙනි.

පිරිවෙන් අධ්‍යාපනයේ මූලික පරමාර්ථ වශයෙන් දක්වා තිබෙන්නේ, පරියත්ති, පටිපත්ති, පටිවේධ යන ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය කෙරෙහි භික්ෂූන් වහන්සේලා අතර උනන්දුවක් ඇති කිරීම, සැරියුත් මුගලන් තෙර පරපුරෙන් පැවත එන සඟ පරපුර අවිච්ඡින්නව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය විනය, ත්‍රිපිටක ඥානය, ධර්ම ගරුක බව භික්ෂූන් වහන්සේලා අතර ඇති කිරීම, දේශීය, විදේශීය ධර්ම දූත මෙහෙයෙහි මෙන් ම භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන්හි නිරතවීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික දැනුම සඳහා ශික්ෂණයක් ලබාදීම, බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, සිංහල, පාලි, සංස්කෘත ඇතුළු භාෂාන්තර හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනුමක් ලබාගැනීම සඳහා භික්ෂූන් වහන්සේලාට පහසුකම් සලසාදීම යනාදිය යි.

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පුස්තකාල සේවාව අතර ඉපැරණිතම පුස්තකාල සේවාව පිරිවෙන් පුස්තකාල සේවාව යි. අනුරාධපුර පොළොන්නරු යුගවල භික්ෂු අධ්‍යාපනික ආයතන තුළ ක්‍රියාත්මක වූ පුස්තකාල"පොත්ගුල්" යන නමින් හඳුන්වනු ලැබීය. පොත්ගුල භික්ෂූන් වහන්සේලා අධ්‍යාපනය හා ආගමික අවශ්‍යතාවන් සඳහා අවශ්‍ය වන්නාවූ පොත්පත්

එක්රැස් කර කරමින් උපයෝජක සේවා පවත්වාගෙන් ගොස් තිබේ. පොත්ගුල් තුළ එක්රැස් කොට තිබූ පොත්පත් එකතු උපයෝගී කරගනිමින් භික්ෂූන් වහන්සේලා සහ පාරිවේණික ශිෂ්‍යයෝ  සිය කියවීම, ලිවීම ආදිය ප්‍රගුණ කළහ.

පිරිවෙන් පුස්තකාලයක මෙහෙවර වන්නේ, පිරිවෙන් අධ්‍යාපන ඉලක්කයන් සපුරාගැනීම පිණිස පාරිවේණික ශිෂ්‍ය ප්‍රජාවගේ හා පිරිවෙන් ආචාර්යවරුන්ගේ තොරතුරු හා තොරතුරු සම්පත් අවශ්‍යතා සපුරාලීමත්, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනයට කටයුතු කිරීමත් ය.  වර්තමානය වන විට අධ්‍යාපන අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන පිරිවෙන් ඒකකයෙහි ලියාපදිංචි පිරිවෙන් ප්‍රමාණය හත්සිය අනූ අට (798) කි. මෙකී සෑම පිරිවෙන් ආයතනයක් සඳහා ම පුස්තකාලයක් ගොඩනැංවීම අනිවාර්ය බව රජය විසින් ප්‍රකාශයට පත් කර තිබේ. ඒ අනුව 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග නම් වූ අති විශේෂ ගැසට් පත්‍රයෙන් සෑම පිරිවෙනකට ම පුස්තකාලයක් හා කියවීම් ශාලාවක් තිබිය යුතු බව දක්වා ඇත. මෙම ගැසට් පත්‍රයට ප්‍රකාරව සෑම පිරිවෙනකටම පුස්තකාලයක් පැවතීම අනිවාර්ය වන අතර පුස්තකාල එකතුව සංවර්ධනය කිරීමට හා පුස්තකාලය නඩත්තු කිරීමට ආධාර ලබාදීමට ද රජය මෙම පනතින් ම බැඳී ඇත.

සෑම පිරිවෙන් ආයතනයක් තුළ ම පුස්තකාලයක් පවතින්නා සේම සෑම පුස්තකාලයකම පාහේ සැලකිය යුතු මට්ටමේ ගුණාත්මක පුස්තකාල එකතුවක්  ද පවතී. නමුත් වර්තමානයේ මතු වී ඇති ගැටලුව වන්නේ මෙකී පිරිවෙන් පුස්තකාල එකතුවත්, සතියකට වතාවක් ලැබී ඇති කාල පරිච්ඡේදයත් ශිෂ්‍යයන් ඵලදායීව භාවිත කරන්නේ ද යන්න යි. මෙවැනි පරිසරයක් තුළ සිදු කරන ලද මෙම අධ්‍යයනයේ අරමුණු මෙසේ හඳුනාගත හැකිය.

## ප්‍රධාන අරමුණ

- ශ්‍රී ලංකාවේ පාරිවේණික ශිෂ්‍යයන් සිය ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය තොරතුරු ගවේෂණයේදී පිරිවෙන් පුස්තකාල භාවිතය අධ්‍යයනය කිරීම.

## උප අරමුණු

- පාරිවේණික ශිෂ්‍යයන්ගේ පුස්තකාල භාවිතයේ ස්වභාවය හඳුනා ගැනීම.
- පුස්තකාල භාවිතය පිළිබඳව පාරිවේණික ශිෂ්‍යයන්ගේ ආකල්ප හඳුනා ගැනීම.
- පුස්තකාල භාවිතයේදී හා තොරතුරු ගවේෂණයේදී ශිෂ්‍යයන් මුහුණපාන ගැටලු හා ප්‍රශ්න හඳුනා ගැනීම.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ පර්යේෂණ නියැදිය වශයෙන්  ශ්‍රී ලංකාවේ පිරිවෙන් පුස්තකාල අතරින් බස්නාහිර පළාතේ පිරිවෙන් පුස්තකාල ස්ථරගත අහඹු නියැදි ක්‍රමය යටතේ තෝරාගන්නා ලදි. ඒ අනුව බස්නාහිර පළාතේ ව්‍යාප්තව ඇති පිරිවෙන් පුස්තකාල අතරින් මහ පිරිවෙන් පුස්තකාල 15 ක් ද විද්‍යායතන පිරිවෙන් පුස්තකාල  10 ක්ද මූලික පිරිවෙන් පුස්තකාල05 ක් ද නියැදිය ලෙස තෝරා ගන්නා ලදී.  නියැදිය තෝරා ගැනීමේදී මහ පිරිවෙන්  පුස්තකාල හා විද්‍යායතන පිරිවෙන් පුස්තකාල වෙත විශේෂ අවධානයක් යොමු කරන ලදී.  ඊට

හේතුව මහ පිරිවෙන් විෂය මාලාව ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවට සමාන වන නිසාත්, විද්‍යායතන පිරිවෙන් විෂය මාලාව විශ්වවිද්‍යාල ප්‍රවේශයට සමාන වන නිසාත් ය. ප්‍රශ්නාවලි ක්‍රමය භාවිත කරමින් ප්‍රාථමික දත්ත රැස්කර කරගත් අතර ද්වීතියික දත්ත, කෘතිවලින් හා පර්යේෂණ නිබන්ධන, පර්යේෂණ ලිපි, සඟරා ලිපි ආදී තොරතුරු මූලාශ්‍රය ඇසුරෙන් ලබා ගන්නා ලදී. ප්‍රශ්නාවලි මාර්ගයෙන් ලබා ගන්නා ලද ප්‍රාථමික දත්තයන් විශ්ලේෂණය කිරීම සඳහා MS-Excel යන මෘදුකාංගය භාවිත කරනු ලැබීය.

ප්‍රස්ථාර අංක 01: පිරිවෙන් පුස්තකාල භාවිතය




මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය, 2019

ඉහත දැක්වෙන ප්‍රස්ථාරය අනුව වැඩි වශයෙන් විද්‍යායතන පිරිවෙන් පුස්තකාල භාවිත කෙරෙන අතර මූලික පිරිවෙන් පුස්තකාල භාවිත වන්නේ ඉතා අවම මට්ටමකිනි. විද්‍යායතන පුස්තකාල සැලකිය යුතු මට්ටමකින් භාවිත කෙරෙන බවත් පැහැදිලි වේ. ඒ අනුව විද්‍යායතන පිරිවෙන්වල අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන් සිය ඉගෙනුම් කටයුතු සඳහා අනෙකුත් පිරිවෙන්වලට සාපේක්ෂව වැඩි වශයෙන් පුස්තකාල භාවිතය සිදු කෙරේ.

ප්‍රස්ථාර අංක 02: පිරිවෙන් පුස්තකාල භාවිතයේ ස්වභාවය




මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය, 2019

පිරිවෙන් වර්ග තුනම නියෝජනය කරනු ලබන ශිෂ්‍යයන්ගෙන් බොහෝ පිරිසක් සතියකට එක් වරක් පුස්තකාලය භාවිත කරනු ලබයි. මෙම ප්‍රතිචාරය ලැබීමට මූලික හේතුව වන්නේ, සෑම පිරිවෙනක ම පාහේ සතියකට එක් කාල පරිච්ඡේදයක් පුස්තකාල භාවිතය සඳහා වෙන් කර තිබීමයි. දිනපතා පුස්තකාලය පරිහරණය කරන ශිෂ්‍ය පිරිසක් මෙන් ම කලාතුරකින් පුස්තකාලය පරිශීලනය කරනු ලබන පිරිසක් ද මෙම ප්‍රස්ථාරය තුළින් හඳුනාගත හැකිය.

ප්‍රස්ථාර අංක 03: පිරිවෙන් පුස්තකාල භාවිතයට හේතු




මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය, 2019

මෙම ප්‍රස්ථාරයට අනුව පුස්තකාලය භාවිත කරනු ලබන පිරිස අතුරින් වැඩි දෙනෙක් ගුරුවරයා විසින් ලබා දෙන්නා වූ අභ්‍යාස සිදු කිරීමට හා ඇගයීම් සම්පාදනය කිරීමට අවශ්‍ය තොරතුරු සපයා ගැනීම සඳහා පුස්තකාලය භාවිත කරනු ලැබේ. එම කරුණු දෙකට අමතරව විනෝදය පිණිස ද කිසියම් ප්‍රමාණයක් පුස්තකාලය භාවිත කරයි. එහිදී විනෝදය පිණිස යන කරුණ හරහා කතන්දර පොත් කියවීම, නවකතා හෝ කෙටිකතා හෝ කියවීම ආදිය සැලකේ.

ප්‍රස්ථාර අංක 04: පිරිවෙන් පුස්තකාල භාවිතයේ ගැටලු




මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය, 2019

පිරිවෙන් පුස්තකාල භාවිතය පහළ අගයක් ගැනීමට මුල් ව ඇති හේතු සාධක අතර ප්‍රධාන හේතුවක් ව ඇත්තේ විධිමත් ව පුස්තකාලය පාඨක තොරතුරු අවශ්‍යතා සන්තෘප්ත කරන අයුරින් හා පාඨක ආකර්ශනය ඇති කරවන අයුරින් සංවිධානය නොවීමයි. එයට ප්‍රමුඛ කාරණය වී ඇත්තේ පුස්තකාලයාධිපතිවරයෙකු පුස්තකාලවල නොමැති වීමයි. පිරිවෙන් වර්ග තුනෙහි ම පුස්තකාලයාධිපතිවරයෙකු නොමැති අතර ඒ වෙනුවට පුස්තකාලය භාර ආචාර්යවරයෙකු සිටී. ඒ අතරිනුත් 20% ක පුස්තකාල ප්‍රමාණයකට පුස්තකාලය භාර ආචාර්යවරයෙකු ද නොමැත.

ප්‍රස්ථාර අංක 04.1: පිරිවෙන් පුස්තකාල භාවිතයේ ගැටලු



මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය, 2019

පිරිවෙන් පුස්තකාල සඳහා පුස්තකාලයාධිපතිවරයෙකු නොමැති බවත්, පුස්තකාලයේ කටයුතු භාරව ක්‍රියා කරන්නේ වෙනත් විෂයයක් භාර ආචාර්යවරයෙකු බවත් යන්න ඉහතින් හඳුනා ගන්නා ලදී. එසේම මෙම ප්‍රස්ථාරයෙන් පැහැදිලි වන්නේ පුස්තකාලය භාරව කටයුතු කරනු ලබන ආචාර්යවරුන්ගෙන් වැඩි ප්‍රතිශතයකට පුස්තකාල සංවිධානය හෝ පරිපාලනය පිළිබඳ වෘත්තිමය අධ්‍යාපනයක් නොමැති බවය.

ප්‍රස්ථාර අංක 05: පුස්තකාල භාවිතය පිළිබඳ ආකල්ප



මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය, 2019

පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව අතුරින් වැඩි පිරිසක් පුස්තකාල භාවිතය පිළිබඳ ව දක්වනු ලබන්නේ ඍණාත්මක ආකල්පයකි. සැලකිය යුතු පිරිසක් පුස්තකාල භාවිතයට වැඩි රුචිකත්වයක් දක්වනු ලබන බව ඉහත ප්‍රස්ථාරයෙන් පැහැදිලි වේ.

මේ අනුව පැහැදිලි වන්නේ පිරිවෙන් වර්ග තුනම නියෝජනය කරනු ලබන ශිෂ්‍යයන් අතුරින් වැඩි ප්‍රමාණයක් සිය ඉගෙනුම් කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු ගවේෂණය කිරීම සඳහා පිරිවෙන් පුස්තකාල භාවිත නොකරන බවත්, එසේම පිරිවෙන් වර්ග තුනෙහි ම පුස්තකාල භාවිත කරනු ලබන ශිෂ්‍යයන් අතුරින් වැඩි පිරිසක් සිය අභ්‍යාස සිදුකිරීම සඳහා සහ ඇගයීම් සම්පාදනය සඳහා අවශ්‍ය තොරතුරු ගවේෂණයේදී පිරිවෙන් පුස්තකාල භාවිත කරන බව අනාවරණය කර ගන්නා ලදී.

## නිගමන

පාරිවේණික ශිෂ්‍යයන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය තොරතුරු ගවේෂණයේදී පිරිවෙන් පුස්තකාල භාවිතය පිළිබඳව සිදු කරන ලද මෙම අධ්‍යයනය තුළින් පහත නිගමනවලට එළඹෙන ලදී.

- මූලික පිරිවෙන්, මහ පිරිවෙන් හා විද්‍යායතන පිරිවෙන් යන පිරිවෙන් වර්ග තුනෙහි ම පාරිවේණික ශිෂ්‍යයන් පිරිවෙන් පුස්තකාල භාවිත කරනු ලබන්නේ අවම මට්ටමකිනි.
- මෙම පිරිවෙන් වර්ග තුන අතුරින් මූලික පිරිවෙන් ශිෂ්‍යයන්ගෙන් 60% කට වැඩි ප්‍රමාණයක් පුස්තකාල භාවිත නොකරයි.
- මහ පිරිවෙන් පුස්තකාල භාවිතය ද සැලකිය යුතු මට්ටමේ පහළ අගයක් ගනු ලැබේ.
- පුස්තකාල එකකතුව සමබර නොවීම, එකතුව යාවත්කාලීන නොවීම, නව තොරතුරුවලින් සමන්විත තොරතුරු මූලාශ්‍රය එකතුවට එක්වීමේ ප්‍රවණතාවය අවම වීම.
- කිසිදු පිරිවෙනක් සඳහා පුස්තකාලයාධිපතිවරයෙකු නොමැති වීම.
- පුස්තකාලය භාරව කටයුතු කරන පිරිවෙන් ආචාර්යවරයාට පුස්තකාලය පිළිබඳවත්, එමගින් සැපයෙන තොරතුරු සේවා හා පුස්තකාල සේවා පිළිබඳවත් ප්‍රමාණවත් අවබෝධයක් නොමැති වීම.
- පුස්තකාල පරිහරණය සඳහා කාල පරිච්ඡේදයක් වෙන් කර ඇති නමුත් එය ඵලදායීව භාවිත නොකිරීම.
- පුස්තකාල භාවිතය පිළිබඳ ව ශිෂ්‍ය ප්‍රජාව තුළ ධනාත්මක ආකල්පයක් නොමැති වීම.
- නව තාක්ෂණය භාවිත නොකිරීම, පුස්තකාල ද්‍රව්‍ය නිසි ලෙස සංරක්ෂණය නොකිරීම හා නිසි ග්‍රන්ථ සංවිධාන ක්‍රම සහ ප්‍රමිති භාවිත නොකිරීම.

## යෝජනා

පිරිවෙන් අධ්‍යාපනය තුළ නිමග්න පාරිවේණික ශිෂ්‍ය ප්‍රජාවගේ ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය තොරතුරු ගවේෂණය කිරීමට හා එම තොරතුරු සිය අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි ලබා ගැනීමට ඇති ප්‍රධානතම තොරතුරු මධ්‍යස්ථානය වන්නේ පිරිවෙන් පුස්තකාලය බව හඳුනාගන්නා ලදී. එය එසේ වුවත් මෙකී පිරිවෙන් පුස්තකාල පාරිවේණික ශිෂ්‍යයන් සිය ඉගෙනුම් ක්‍රියාවලිය ඵලදායී කර ගැනීම සඳහා වැඩි වශයෙන් භාවිත නොකරන බවත්, එවැනි තත්ත්වයක් ඇති වීමට විවිධ හේතු සාධක මුල් වී ඇති බවත් මෙම අධ්‍යයනය තුළින් අනාවරණය කරගන්නා ලදී. පිරිවෙන් පුස්තකාල පද්ධතිය තුළ ඉස්මතුව තිබෙන මෙකී ගැටලුකාරී තත්ත්වයන් මග හරවා පිරිවෙන් අධ්‍යාපනය ක්‍රියාවලියට සෘජු දායකත්වයක් සපයනු ලබන ප්‍රධාන තොරතුරු මධ්‍යස්ථානයක් බවට පිරිවෙන් පුස්තකාල පත් කිරීම අරමුණු කර ගෙන මෙම යෝජනා ඉදිරිපත් කෙරේ.

- පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ වෘත්තිය අධ්‍යාපනයක් ලද වෘත්තිකයන් පිරිවෙන් පුස්තකාලයාධිපති සේවයෙහි පිහිටුවීම.
- සමබර තොරතුරු සහිත නව්‍ය තොරතුරු මූලශ්‍රයන්ගෙන් සමන්විත පුස්තකාල එකතුවක් ගොඩනැංවීම හා එම එකතුව යාවත්කාලීන කිරීම.
- පිරිවෙන් පුස්තකාල සඳහා යෝග්‍ය පහසුවෙන් භාවිත කළහැකි වර්ගීකරණ ක්‍රමයක් සකස් කොට එයට අනුව එකතුව සංවිධානය කිරීම.
- පාරිවේණික ශිෂ්‍යයන් පුස්තකාලය වෙත ආකර්ෂණය කරගැනීම සඳහා විවිධ වැඩ සටහන් සංවිධානය කිරීම.
- ශිෂ්‍ය ප්‍රජාවට කියවීමේ රුචිය ඇති කරලීම සඳහා කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම.
- ඇගයීම් පාදක අධ්‍යාපන ක්‍රමයක් ඔස්සේ ශිෂ්‍ය ප්‍රජාව පුස්තකාල භාවිතයට හුරු කරවීම.
- පුස්තකාල පරිහරණය සඳහා වෙන් කර ඇති කාල පරිච්ඡේදය ඵලදායීව භාවිත කිරීමට විධිමත් ක්‍රියාපටිපාටියක් සකස්කිරීම.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අධිකාරම්, ඊ. ඩබ්ලිව්. (1963). පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය. කේ.කේ. ජී. ජයවර්ධන සහ සමාගම, කොළඹ.

ඇඳගම, මාලනී. (1994). ශ්‍රී ලංකාවේ පිරිවෙන් පුස්තකාල ආරම්භය හා වර්ධනය.සද්ධර්මාකර ශාස්ත්‍රීය ලිපි සරණිය, සද්ධර්මාකර පිරිවෙන, පින්වත්ත.

කුරුප්පු, ඩබ්ලිව්. (1964). ලංකාවේ සුප්‍රසිද්ධ විද්‍යාපීඨ, අධ්‍යාපනයේ සියවස.අධ්‍යාපන අමාත්‍යංශය, කොළඹ.

පඤ්ඤාකර හිමි, නාත්තන්ඩියේ. (1967). පුරාණ ලංකාවේ පොත්ගුල් හා ඒවායේ ආරක්ෂාවට භික්ෂූන්ගෙන් සිදුවූ සේවාව, seylon library reveiw: Journal of the Ceylon library association,

පඤ්ඤාලෝක හිමි, මීගොඩ. (2002). ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය. ගොඩගේ, මරදාන.

පියරතන හිමි, ලැගුම්දෙණියේ. (2006). අනුරාධපුර යුගයේ ආරාමික පුස්තකාල. පුස්තකාල විද්‍යා ලේඛන සමුච්චය පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය

රණසිංහ, ආර්. අයි. එස්. (2006). පැරණි ලංකාවේ පොත්ගුල් සම්ප්‍රදාය. මහරගම

තලගමුව, ඒ. (19947). ශ්‍රී ලංකාවේ පිරිවෙන් පුස්තකාල ආරම්භය සහ වර්ධනය. සද්ධර්මාකර ශාස්ත්‍රීය ලිපි සරණය,සද්ධර්මාකර පිරිවෙන, පින්වත්ත.

# A Study on Role of Publication for Dissemination of Knowledge in Sri Lanka

**P. M. Ayomi**

*Senior Assistant Librarian, Institute of Indigenous Medicine, University of Colombo, Sri Lanka*
*ayomimp@yahoo.com*

## ABSTRACT

In yester era various types of material used for writing purposes and store the knowledge .The Knowledge based society is a very essential fact for national development. Sri Lanka has a long history of writing and literary activities with historical recodes and archival evidence. Buddhist texts were systematically documented on Ola leaf at Matale Aluvihare in Sri Lanka. Publication history in Sri Lanka was traced back to Portuguese era. Also the first printing press was established in Sri Lanka by Dutch in 1734. There are so many Information methods to communicate the knowledge. Among them published book is the main source of communication method. Books are filled with Knowledge, parable, insights to a happy life, helpful topics about life, love, fear, child rearing, prayer, worship and helpful advices and publication of books serves as a particularly important parameter of the knowledge field. This research was conducted to investigate the status of publication level of subject, publisher's contribution to publish books, publication pattern and language barriers for knowledge dissemination and to investigate lack of publication, and to identify which kinds of books were published during the period of last five years. Survey method was used for this study as the main research tool. Data were collected from National Bibliography in Sri Lanka from 2013 to 2017, and used Dewey decimal classification system for classifying the knowledge. Gathered data were tabulated according to subject, language, publisher and total amount of publication in each respective year (2013-2017). A finding of the study shows that authors have published more books in literature subject field. As the data indicated that most of the books were published in Sinhala and English Language but Tamil books were less. It was revealed that S .Godage Publisher was the highest contributor in publishing books in Sri Lanka. In addition study found that most of the Authors were willing to publish their publication as author publication. And suggest to increase the publish in books in other subject disciplines. The Government of Sri Lanka should give financial support to authors to publish their publication and resources for publishers that will support the future competitiveness of the book publishing industry. This research was limited only to printed books.

**Keywords:** Publication, Dissemination of knowledge, Information, Publisher

# ශ්‍රී ලංකාවේ දැනුම ව්‍යාප්තිය සඳහා ප්‍රකාශන පළකිරීමෙන් සිදු වී ඇති දායකත්වය පිළිබඳ විමසා බැලීමක්

## හැඳින්වීම

භාෂණයෙන් පැවත එන දැනුම පරපුරෙන් පරපුරට රැක ගැනීම, රැස් කර තබා ගැනීම සඳහා භාෂාවේ අතුරු ඵලයක් ලෙස ලේඛන කලාව ආරම්භ වී ඇත. ලේඛනයේ ආරම්භය සනාථ කරලීම සඳහා අතීතයේ විවිධ සාධක දක්නට ලැබේ. එසේ බිහිවී ඇති ලේඛන අතරින් බැබිලෝනියාවේ, මිසරය, ස්පාඤ්ඤය වැනි රටවල ඉපැරණි බිතු සිතුවම් වල නිරූපිත චිත්‍රාක්ෂර ලේඛනයේ ආදිතම ස්වරූපය ප්‍රකට කරන බව පුරාවිද්‍යා මතය වේ. පසුව සංකේතාක්ෂර, ශබ්දාක්ෂර වැනි අක්ෂර ක්‍රමවේද භාවිත වූ බව සැලකේ. එමෙන්ම මොහෙන්දජාරොහරප්පා ශිෂ්ටාචාර යුගයේ චිත්‍රාක්ෂර විශ්වීය ලේඛනයේ ප්‍රාරම්භය බව ද දැක්වේ (සාසනධජ, 2013).

ඉතිහාසයේ මුලින්ම හමුවන ශිලා ලේඛනවල ඉතිහාසය ක්‍රි.පූ. 20 වන සියවස දක්වා ඈතට දිව යයි. ඒවායෙන් විවිධ සංකේත, රූප රටා, අක්ෂර, සටහන් ආදිය නිරූපණය වේ. ක්‍රි.ව. 1440 දී ජර්මන් ජාතික ජොහාන්ස් ගුටැන්බර්ග් මුද්‍රණ යන්ත්‍රයක් උපයෝගී කරගෙන ලේඛන කලාව ආරම්භ කිරීම ලේඛනකරණයේ වේගවත් දියුණුවක් ඇති වීමට බෙහෙවින් ඉවහල් විය (රූබසිංහ,2012).

ක්‍රි.පූ. 3 සියවසේ පමණ මෙරට ඇති වූ ලේඛන කලාව නිසා මුලින්ම ඇරඹී ලෙන් ලිපි වල යම් යම් තොරතුරු සටහන් කිරීම සිදුවිය. මේ සඳහා ඉන්දියාවෙන් රැගෙන ආ බ්‍රාහ්මීය අක්ෂර මාලාව යොදා ගැනිණි. ක්‍රි.පූ. 1 වන සියවසේ වළගම්බා රජු සමයේ මාතලේ අළුවිහාරයේ භික්ෂූන් වහන්සේලා කටපාඩමින් රැගෙන ආ අටුවා සහිත පෙල දහම ග්‍රන්ථාරූඪ කිරීම ලංකාවේ ලේඛනකරණයේ ප්‍රධාන සන්ධිස්ථානයකි. ශ්‍රී ලංකාවට කඩදාසි භාවිතය හඳුන්වා දුන්නේ ක්‍රි.ව. දහසය වන සියවසේ මුහුද බඩ අල්ලා ගත් පෘතුගීසීන් විසිනි.

## ශ්‍රී ලංකාවේ ප්‍රකාශන කර්මාන්තයේ ආරම්භය

මුද්‍රණ ග්‍රන්ථ ප්‍රකාශනයේ ඉතිහාසය ලන්දේසි පාලන සමය දක්වා දිවයයි. 1640-1796 ප්‍රථම සිංහල ග්‍රන්ථය ප්‍රකාශයට පත් කිරීමේ ගෞරවය ලන්දේසි ජාතිකයන්ට හිමිවේ (පෙරේරා, වී.එන්.කේ.2011). පළමු සිංහල පොත 1737 දී වැන් ඉන්හෝෆ්ගේ (Van Imhoff) නම් ආණ්ඩුකාරවරයාගේ කාලයේදී සිංහල යාඥා පොත යනුවෙන් ප්‍රකාශයට පත් විය (කළුආරච්චි, සමන්, 2002).

ලංකාණ්ඩුවේ මුද්‍රණාලය වර්ෂ 1849 දී බ්‍රිතාන්‍යයන් විසින් රජයේ මුද්‍රණ කාර්යාලය නමින් වඩා සංවිධානාත්මක මුහුණුවරකින් ගොඩනගන ලදී. ශ්‍රී ලංකාවේ මුල්ම සිංහල පුවත්පත ලෙස 1860 පළ වූ ලංකාලෝක පුවත්පත ගාල්ලේ පිහිටුවා තිබූ ලංකාලෝක නැමති මුද්‍රණාලයේ ප්‍රකාශයට පත් කර ඇත. එහෙත් රජයේ ලියා පදිංචි කරන ලද පැරණිතම සිංහල පුවත්පත වන්නේ 1862 වසරේ නිකුත් වූ ලක්මිණි පහන පුවත්පතය (පෙරේරා, වී. එන්.කේ,2011).

ඉගෙනීම යනු පුද්ගලයා තුළ දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය කිරීමේ ක්‍රියාවලියකි. ඉගෙනීම යන්නෙන් අධ්‍යාපනය, ඉගැන්වීම, ඇගයීම, රස විඳීම, පුහුණුව ආදී පුළුල් ක්ෂේත්‍ර කියැවේ. ඉගෙනීම යනු පුද්ගලයෙකුගේ පමණක් නොව සමස්ත සමාජ සංවර්ධනයේ පදනම වන බව 21 වන සියවසේ අධ්‍යාපනය පිළිබඳ වූ ඩෙලර් වාර්තාව (1996) පෙන්වා දෙයි. නිදහස් අධ්‍යාපනය, යාවජීව අධ්‍යාපනය, සැමට අධ්‍යාපනය, දිවි පැවැත්ම සඳහා අධ්‍යාපනය, ප්‍රාග්ධනය ඉලක්ක කොටගත් අධ්‍යාපනය වැනි නොයෙකුත් තේමා පිළිබඳව අවධානය දෙමින් සැම රටක්ම සිය අධ්‍යාපන සැලසුම් ද සකස් කරනු ලබයි. තාක්ෂණයේ දියුණුවත් සමග "සන්නිවේදන මාධ්‍යය" ද ඉගෙනීම සඳහා භාවිත කරන්නට උත්සුක වෙයි. සිසුන්ට විවිධ මාධ්‍ය භාවිතයන් ඔස්සේ ඉගෙනීමට අවස්ථාව සැලසීම මගින් ඉගෙනීමේ ඉලක්කය වන සමානාත්මතාව තහවුරුවීම යන කරුණු ඔස්සේ සිසුන්ගේ ඉගෙනීමේ ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා වැදගත් වන බව ඇල්කාන් (Alkan, 1999) අනාවරණය කොට තිබේ.

වර්තමානය තුළ අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා අන්තර්ජාලය වැනි අතිරේක ඉගෙනුම් (Suplimentary Learning) භාවිත කිරීම වැදගත් ය (UNESCO, 1996). මෙවැනි තත්ත්වයක් තුළ, ලෝකයේ වීඩියෝ පාදක ඊ - ඉගෙනුම් ක්‍රමය වැනි දුරස්ථ අධ්‍යාපන මෙවලමක් භාවිත කරමින් ශාස්ත්‍රාලීය ආයතන තම සිසුන්ගේ අධ්‍යාපන ඵලදායිතාව වැඩි දියුණු කිරීමට උත්සාහ දරමින් සිටියි. Blended Learning තුළ සිසුන් සහ ගුරුවරයා අතර අන්තර් ක්‍රියාකාරීත්වයක් ඇති වන වීඩියෝ පට ලෙස පාඩම් කරුණුවලට අදාළ වෙනත් කරුණු ඉතා සියුම් ආකාරයෙන් ඇතුළත් කිරීම ද මෙහි තවත් එක් අඩියරකි. දුරස්ථ අධ්‍යාපන ක්‍රියාවලිය 1728 දී ආරම්භ වී ක්‍රමයෙන් වර්තමානය දක්වා වර්ධනය විය.මෙවැනි තත්ත්වයක් තුළ ඊ - ඉගෙනුම් ක්‍රමය (eLearning) හඳුනා ගැනීම සඳහා ඇනෝහිමා (Anohima, 2005) විසින් සිදු කරන ලද ආකෘති විග්‍රහය වැදගත් ය.

රූප සටහන අංක 01 : ඊ-ඉගෙනුම් ක්‍රමය සඳහා වන ආකෘතියක්




FIGURE 1 The subset relationships between the terms (Anohima 2005).

දුරස්ථ අධ්‍යාපනයේදී අන්තර්ජාලය පදනම් කරගත් ඉගෙනීමේ සංකල්පය වෙබ් පාදක ඉගෙනීමට වඩා පුළුල් ය. වෙබ් යනු ඒකාබද්ධ ලේඛන ආකෘතිය (HTML), බ්‍රව්සර්, හයිපර් ටෙක්ස්ට් සහ ඒකාබද්ධ සම්පත් ලොකේටරය (URL), භාවිත කරන අන්තර්ජාල සේවාවන්ගෙන් එකක් පමණක් වන අතර එය HTTP ප්‍රොටෝකෝලය මත පදනම් වේ. අන්තර් සම්බන්ධිත පරිගණක ජාල දහස් ගණනකින් (ජාතික, කලාපීය, වාණිජ සහ ආයතනික) සමන්විත ලොව විශාලතම ජාලය අන්තර්ජාලයයි. එය වෙබ් පමණක් නොව විද්‍යුත් තැපැල යනාදිය ද සපයයි. එබැවින් ඉගෙනීම වෙබ් පදනම මත පමණක් නොව, ඊමේල් හරහා ලිපි හුවමාරුවක් ලෙස ද භාවිත කළ හැකි ය. එබැවින් Internet Based Learning යනු Online Learning හි උප කුලකයක් පමණි. පරිගණකය මත පදනම් වූ ඉගෙනීම මගින් පරිගණකය ජාලයකට (Network) සම්බන්ධ වී නැති නමුත් ඉගෙනීම සිදු කළ හැකි බැවින් Internet Based Learning හි උප කොටසක් නොවේ. විද්‍යුත් ඉගෙනුම් ඕනෑම විද්‍යුත් මාධ්‍යයක් හරහා සිදු වේ. එනිසා Computer Based Learning in Online Learning යනු විද්‍යුත් ඉගෙනුම් උප කාණ්ඩ වේ. විද්‍යුත් ඉගෙනීමට වඩා දුරස්ථ ඉගෙනීම පුළුල් ය. එය විද්‍යුත් හා විද්‍යුත් නොවන ඉගෙනුම් යන කොටස් දෙකම ආවරණය කරන ඉගෙනුම් ක්‍රියාවලියකි (Anohina, 2005). කාලය හා ස්ථානය අදාළ නොකරගෙන පහසුවෙන් ඇතුල් වීමේ හැකියාව, පිරිවැය සහ කාලය ඉතිරි කිරීම, ඉගෙනුම් කේන්ද්‍රීය ක්‍රියාකාරකම් සක්‍රීය කිරීමෙන් ස්වයං ඉගෙනීම අසීමිත ප්‍රවේශයකින් ඉගෙනීම සඳහා භාවිත කළ හැකි යෙදවුමක් වීම, කාලානුරූපීව වෙනස්වන දැනුම ලබාගත හැකිවීම සහ වීඩියෝ මගින් සිසුන්ට සත්‍ය වස්තූන් හා යථාර්ථවාදී දර්ශන නැරඹීමට හැකි ලෙස ඊ - ඉගෙනුම් ක්‍රමය වාසි සහගත වේ. මේ අතර වීඩියෝ පාදක ඉගෙනුම් ක්‍රියාවලිය තුළින් ඉගෙනීමට අනුබලදීම, උපදෙස්දීම, කරුණු දැක්වීම හා පැහැදිලි කිරීම, සාරාංශ කිරීම, ඉගෙනුම් ශක්තිය වැඩිකිරීම, පෙළඹවීම හා දිරිගැන්වීම වෙනත් ඉගෙනුම් ද්‍රව්‍ය සඳහා සහායික මාධ්‍යයක් ලෙස භාවිතය හා ඉගෙනුම් වේගය වැඩි කිරීම, තොරතුරු භාවිතයන් ගෙනහැර දැක්වීම, සිසුන්ගේ චර්යයාව වෙනස් කිරීම, ළඟාවිය නොහැකි සිද්ධීන් හා තොරතුරු වඩාත් පැහැදිලිව ඉදිරිපත් කිරීම යන ප්‍රතිඵල රාශියක් ලබාගත හැකි බව හිසල් (Hisal, 1983, p.57) පෙන්වා දෙයි. මෙවැනි තත්ත්වයක් තුළ ශ්‍රී ලංකාවේ ද බොහෝ ශාස්ත්‍රාලීය අධ්‍යාපන ආයතනවල සිසුන්ට අන්තර්ජාල වීඩියෝ හරහා ඉගෙනීමට අවස්ථාව උදාවී තිබීම විශ්වවිද්‍යාල අධ්‍යාපනයේදී කොතරම් වැදගත්කමක් ලබා දෙන්නේදැයි අධ්‍යයනයට ලක් විය යුත්තකිග

## පර්යේෂණ අරමුණු

ශාස්ත්‍රාලීය අධ්‍යාපන ආයතනවල සිසුන්ට අන්තර්ජාල වීඩියෝ හරහා ඉගෙනීමට අවස්ථාව උදා වී තිබීම යන උපකල්පනය පාදක කරගනිමින් එසේ ඉගෙනීමේ ඵලදායිතාව නිරීක්ෂණය කිරීම මෙම පර්යේෂණයේ දී සිදු කෙරිණි. ගුරුවරයාගේ මගපෙන්වීම මත පංති කාමරය තුළ දී සහ ඉන් පිටතදී ස්වයං ඉගෙනුම් උපකරණයක් ලෙස සිසුන් අන්තර්ජාල වීඩියෝ භාවිත කිරීම නිසා එම තත්ත්වය ඔවුන්ගේ අධ්‍යාපන තත්ත්වය වැඩි දියුණු කරන මෙවලමක් වශයෙන් කොතරම් ඵලදායිතාවක් ලබා දී තිබේ ද යන්න මෙහිදී අධ්‍යයනයට ලක්විය.

## ප්‍රතිපල හා සාකච්ඡා

කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයීය ශ්‍රීපාලි මණ්ඩපයේ ජන මාධ්‍යය විෂය හදාරණ සිසුන් අතරින් සිසුන් 100 දෙනෙකු සසම්භාවී

නියැදි ක්‍රමය හරහා තෝරා ගන්නා ලදී. මෙම අධ්‍යයනයට ප්‍රාථමික දත්ත ලබාගැනීමේදී ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා යන ක්‍රමවේද භාවිතකරන ලදී. ද්විතීයික දත්ත වශයෙන් පොත්පත්, සඟරා, ලිපි සහ අන්තර්ජාලය යන මූලාශ්‍රයන් ද භාවිතයට ගැනිණි.

වගු අංක 01: විශ්වවිද්‍යාලවල සිසුන්ට අන්තර්ජාල වීඩියෝ මගින් ඉගෙනීමට අවස්ථාව උදාවන විවිධ ආකාර පිළිබඳ දත්ත විශ්ලේෂණය

| S.No. | **මිශ්‍ර ඉගෙනීමේ ක්‍රමයක් ලෙස** (Blended Learning) (n=75) | **දේශන සඳහා ඉගෙනුම් උප කාරකයක් ලෙස** (Suported Learningin the Lectures) (n=75) | **ස්වයං ඉගෙනුම් ක්‍රමයක් ලෙස** (Self learning) (n=75) |
|---|---|---|---|
| University of Kelaniya | 45 | 60 | 60 |
| Sri Palee Cam-pus | 50 | 57 | 72 |

## ප්‍රතිඵල හා සාකච්ඡා

කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදනය හදාරණ සිසුන් අතරින් මිශ්‍ර ඉගෙනීමේ ක්‍රමයක් ලෙස (Blended Learning)වීඩියෝ පාදක අන්තර්ජාල ඉගෙනුම් ක්‍රියාවලිය සමග සම්බන්ධ වන සිසුන් සංඛ්‍යාව 45% ක් වන අතර ශ්‍රීපාලි මණ්ඩපයේ 50 % කි. සිසුන්ට ඔවුන්ගේ අන්තර්ජාල ඉගෙනුම් ක්‍රියාවලිය තුළ වීඩියෝ පාදක කරගත් ඉගෙනුම් මොනවාද යන්න නිදහසේ තෝරා ගැනීමට අවස්ථාව ලබා දුන් විට, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ස්වයං ඉගෙනීම සඳහා අන්තර්ජාල ඉගෙනුම් ක්‍රියාවලිය සමග සම්බන්ධවීම ඉතා වැඩිබව පෙනී ගියේ ය. ඒ ශ්‍රීපාලි මණ්ඩපයේ සිසුන් 96% ක් සහ කැලණිය විශ්වවිද්‍යාලයේ සිසුන් 80% ක් වශයෙනි. මේ අනුව සිසුන් පැහැදිලිවම යෝජනා කරනුයේ, පංති කාමරය තුළදී අන්තර්ජාල ඉගෙනුම් ක්‍රියාවලිය තුළ වීඩියෝ පාදක කරගත් ඉගැන්වීම සංවිධානය කිරීමේදී ද සිසුන් කැලණිය සහ ශ්‍රීපාලි මණ්ඩපය තුළ පිළිවෙලින් 80% සහ 76% වශයෙන් සිටින බවයි. මෙම අවස්ථාවන්ගෙන්, වීඩියෝ පාදක කරගත් ඉගෙනුම් අන්තර්ජාලය හරහා සිදු කරන විට ඔවුන්ගේ අවධාරණය, ධාරණය, දැනුම උත්පාදනය, පෙළඹවීම යන කරුණු පිළිබඳව සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් තොරතුරු ලබා ගන්නා ලදී. එසේ වුවද, එක්තරා කාණ්ඩයකට අයත් වුවද, අවශ්‍ය විටෙක සිසුන් වෙනත් ආකාරවලින් අධ්‍යයනය අන්තර්ජාලය පදනම් කරගනිමින් වීඩියෝ මගින් තමන්ගේ ඉගෙනුම් කටයුතු කිරීමට සඳහා සහභාගී වූ බව සැලකිල්ලට ගත යුතුය. අන්තර්ජාලය පදනම් කරගනිමින් වීඩියෝ මගින් තමන්ගේ ඉගෙනුම් කටයුතු කිරීමට යාමේදී දේශනවලට වැඩි වශයෙන් සහභාගී වීම, සාමාන්‍යයට වඩා ඉහළ ලකුණු ලබා ගැනීම සහ පාඩම් මාලා වඩා හොඳින් සම්පූර්ණ කිරීම මෙම සිසුන්ගේ ස්වභාවය විය. චර්යා, ආකල්ප, ඇදහීම් හා වටිනාකම්, දැනුම හා ප්‍රජානන කුසලතා කෙරෙහි ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් වන වීඩියෝ ප්‍රබල බලපෑමක් කරයි. නිරීක්ෂණය (Observation), අනුකරණය (Imitation) හා ආදර්ශනය (Model) ඉගෙනුම කෙරේ බලපාන අතර මෙයින් ආදර්ශනය සජීව ආකෘති (Live Model), වාචික ඉගැන්වීම් (Verbal Instructions) හා සංකේතමය

(Symbolic) ලෙස ශිෂ්‍ය ප්‍රබෝධනයට හේතුකාරක වෙයි. අන්තර්ජාලය මගින් ලබා ගන්නා ඉගෙනුම් කරුණු මගින් ඔවුන්ගේ ප්‍රජානන හා චර්යාත්මක සන්තතිය (Cognitive and Behavioral Process) බලපාන බැවින් අන්තර්ජාල වීඩියෝ පාඩම් මගින් ඉගෙනීමේදී සිසුන්ගේ අවධානය (Attention), ධාරණය (Retention), දැනුම උත්පාදනය (Reproduction) හා පෙළඹවීම (Motivation) සඳහා අවස්ථා පුළුල් කළහැකි බව පෙනී ගියේ ය.

## නිගමන

- අන්තර්ජාලය හරහා ඉගෙනීම තුළින් අදියරෙන් අදියර පන්ති කාමරයේ ඉගෙනීමට ඵලදායී මැදිහත්වීමක් වූ බව පැහැදිලිව නිගමනය වෙයි.
- එසේම අන්තර්ජාලය හරහා වීඩියෝ පාදක කරගත් ඉගෙනීම ගුරු ඌනතාවට විසඳුම් දීම, අපැහැදිලි සහ කම්මැලි සහගත ඉගැන්වීම් ක්‍රම අවම කිරීමට ද හැකිවන බව නිගමනය විය.
- අදෘශ්‍ය හා කිසිදිනෙක අත්දැකිය නොහැකි සිද්ධීන් සජීවීකරණය (Animation) ලෙස ඉගෙනීමට හැකිවීම තුළින් සිසුන්ට කෙටි කාල පරාසයක් තුළ වැඩි දැනුම් ප්‍රමාණයක් සරලව ලබාගත හැකි යග
- ශාස්ත්‍රාලීය අධ්‍යාපන ආයල සිසුන්ට අන්තර්ජාල වීඩියෝ හරහා ඉගෙනීමට අවස්ථාව උදාවී තිබීම මගින් බුද්ධිමය වර්ධනයක් සපයමින් එය විද්‍යාත්මක තර්කනය, වියුක්ත චින්තනය සහ විධිමත් ක්‍රියාකාරිත්වයට මග පෙන්වන බවයි.

## යෝජනා

- ඉගෙනීම සිදු වන්නේ අධ්‍යාපනය හදාරනු ලබන්නන් විසින් අභ්‍යන්තර නිරූපනයන් ගොඩනගන විට දැනුම ලබාගැනීමෙනි. එබැවින් ස්වයං ඉගෙනුම් ක්‍රම මගින් අධ්‍යාපන ක්‍රියාවලිය වඩාත් වැඩිදියුණු කිරීම ද සිසුන් විසින් සිදුකිරීම යෝග්‍ය වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


කුලරත්න ඩබ්. ජී. (2015). ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ විප්ලවීය වෙනසක් අවශ්‍ය ය, රාවය. ඊඩ්හ්ගකනරැඑවග9748

කුලරත්න ඩබ්. ජී. (2000). අධ්‍යාපන සැලසුම්කරණය, සාර ප්‍රකාශන හා මුද්‍රණ, අතුරුගිරිය පාර, කොට්ටාව

Alla Anohina. (2005). Analysis of Terminology Used in the Field of Virtual Learning, Faculty of Computer Science and Information Technology, Institute of Applied Computer Systems Riga Technical University.

Alkan'(1999). Educational Technology and Conceptual Dimension of Distance Education.

Atkinson, C. (1983). Education by radio in American Schools, Nashville, TN: Peabody College for teachers.

Bates, A.W. (1995). Television, Learning and Distance Education. Journal of Educational television. vol 14, No.3, 213-215.

Darrow, Ben H. (1932). Radio: The Assistant Teacher. Columbus. OH: RG Adams & Company.

Hizal, A. (1983). Distance Education, Trends and Issue Alerts. Columbus, ERIC Clearinghouse on Adult, career and Vocational Education, the Ohio states University.

Levenson, Williams B. and Stasheff, Edward (1952). Revised from 1945. Teaching Thought Radio and Television. New York: Rinehart & company. Inc.

UNESCO (1996). Delores Report learning: the treasure within (1996), http://unesdoc.unesco.org/images/0010/001095/1095 90eo.pd

# Information Needs and Information Seeking Behavior of Undergraduates of Faculty of Commerce and Management Studies: A study based on University of Kelaniya

**S.A.G. Lakmali**

*Project Assistant, Library, Open University of Sri Lanka, Sri Lanka.*
*gayani.sal@gmail.com*

**P.A.I Peiris**

*Assistant Librarian, Library, Open University of Sri Lanka, Badulla Regional Center, Sri Lanka.*
*anupamapeiris92@gmail.com*

## ABSTRACT

The most valuable commodity in this age is information. Information provides awareness, knowledge and power (Isazadeh, 2014). In 21st century, information has become a living thing. This study examines the information needs and information seeking behavior of faculty of commerce and management studies undergraduates in University of Kelaniya. The purposes of the study are, identifying the information seeking patterns of undergraduate students of faculty of commerce and management studies, detecting the problems that undergraduate facing when accessing to the required information. The study adapted a survey method and 2016/2017 academic year undergraduate students of faculty of commerce and management studies in University of Kelaniya were used as the simple. A self-administered questionnaire was distributed to collect data among the commerce and management studies undergraduates of the University of Kelaniya. According to the study most of undergraduates identified that assignment purpose, research work and note making were their basic information needs. Majority of the users are preferred to use resources available on both of electronic and printed materials. The findings revealed that user awareness is not enough regarding e-resources and requested advance training for undergraduates about using on OPAC. The study suggests that, all of library services and strategic should be designed and target to improving and identifying information needs and information seeking behavior among students and it is very useful for racing students'awareness and usage. Moreover,library should give best practice and knowledge about searching strategy by organizing workshops, printing leaflets etc.

**Keywords:** information seeking behavior, information skills, e-resources, information literacy

## INTRODUCTION

The present age which we are living is the 'information era'. Information has become an essential component for the growth and development of a society. In any sector, peoples are searching information to achieve various purposes. At present, people even can't live without information. The reason is that, information has become inevitable need of people.

Information seeking is a human process that requires adoptive and reflective control over the afferent and efferent actions of the information seeking. Information seeking is a dynamic and changeable process despite its formal problem-solving attributes. It depends on the situations, but also large extent on the individual performing it. (Paliwal, 2016) Information-seeking behavior contains with the searching, locating, retrieving, and using of information.

Many librarians, library professionals and information managers have a tendency to study the information-seeking behavior of the users. They can recognize the information needs and seeking patterns the users maintain and then can design and implement information services to satisfy user's requirements. This study examines the information needs and information seeking behavior of faculty of commerce and management studies undergraduates in University of Kelaniya.

## OBJECTIVES OF THE STUDY

The objectives of the study were:

- To identify the information seeking patterns of undergraduate students of faculty of commerce and management studies
- To explore the problems that undergraduate facing when accessing to the required information
- To identify practicable techniques for effective information seeking behavior

## METHODOLOGY

The study adapted a survey method and 2016/2017 academic year undergraduate students of faculty of commerce and management studies in University of Kelaniya were used as the sample. A self-administered questionnaire was distributed to collect data. Selected simple random sampling method was used as the data collecting technique and SPSS software was used for the data analysis.

## RESULTS AND DISCUSSION

### *Purpose of Seeking Information*

Survey respondents were asked about the Purpose of seeking information. As indicated in Table 1, the majority of respondents mentioned that, assignments related work (29%) , note making (24%) and research work (16 %) are the three main purposes of information seeking. Orderly, 14%, 11%, 6% get for reading books, reading journals and entertainment purposes of information seeking.

Table 1: Purpose of seeking information

| Purpose of seeking information | Percentage |
|---|---:|
| Read books | 14% |
| Read journals | 11% |
| Research work | 16% |
| Note making | 24% |
| Entertainment | 6% |
| Assignments | 29% |

Source: Survey Data

### *Preference of formats by Users*

According to the respondents' preference for using of necessary format for information seeking, figure 1 shows that substantial majority prefer to use both printed and electronic formats. Response rate was 53%. however, undergraduates prefer to electronic sources and they also expressed a need for training in the use of these resources.




Source: Survey Data

### *OPAC Usage*

This study explored the Management Faculty students' usage of OPAC. The noteworthy undergraduates do not know how to use the OPAC. It was 65%. They use shelf reading method and get introduction from the staff members to find books.

### *Undergraduate Students Satisfaction with Library Collection*

Survey respondents were asked about the satisfaction of undergraduates of faculty of commerce and management studies about library collection. Table 2 shows that majority of responders report their satisfaction on thesis collection as very good. Textbooks, Journals, Reference books, E-Resources were rated good by nearly half. Most of the undergraduate students' had good satisfaction about library collection.

Table 2: Undergraduate Students Satisfaction with Library Collection

| **Type of material** | **Very good (%)** | **Good (%)** | **Fair (%** | **Poor (%)** |
|---|---|---|---|---|
| Textbooks | 25 | 56 | 13 | 6 |
| Reference books | 24 | 35 | 31 | 10 |
| Journals | 21 | 39 | 28 | 12 |
| Thesis | 73 | 22 | 5 | 0 |
| E-Resources | 27 | 37 | 29 | 7 |

### *Difficulties Faced in Using the Library*

Figure 2: Difficulties faced in using the library




Source: Survey Data

igure 2 shows that as substantial majority responded lack of knowledge regarding e-resources (28%), insufficient user awareness regarding available management resources in the library (25%), not familiar with OPAC (23%) are the problems which faced by users.

### *Internet Usage for Information Gathering*

Under the usage of internet, the study explored the use of internet and purpose of using internet for the academic activities. Most of the undergraduates use internet for their academic activities. Response rate was 98%. Figure 3 indicates that assignment purpose, research work was most responded purpose of using internet for academic activities.

Figure 3: purpose of using internet for academic activities




Source: Survey Data

## CONCLUSION AND RECOMMENDATION

Findings of this study reveal about information seeking activities of undergraduates of Faculty of Commerce and Management Studies, University of Kelaniya. The findings revealed that most of undergraduates used the library for assignmense, research work and note making. They use information sources only for their studies. Majority of the users are preferred to use resources available on both of electronic and printed materials. Most of the undergraduates used internet for their academic activities. According to the study, knowledge of the users is insufficient regarding e-resources in the library and insufficient user awareness regarding available management resources in the library and need of advance training for undergraduates for using OPAC were also observed.

The study suggests that all of library services and strategies should be arranged with the aim for improving toward information needs and information seeking behavior, for racing students' awareness, skills and usage. Therefore user opinion, perception, information needs should be considered when providing library services. In addition, library should give best practice and knowledge about searching strategy by organizing workshops, printing leaflets, etc.

## REFERENCES


Ashikuzzaman. (2018). Information Seeking Behaviour Models: An Overview. Retrieved from http://www.lisbdnet.com/information-seeking/

Ian D. Gordon, Patricia Meindl, Michael White & Kathy Szigeti. (2018). Information Seeking Behaviors,udes, and Choices of Academic Chemists, Science & Technology Libraries. Retrieved from https://www.tandfonline.com/doi/full/10.1080/0194262X.2018.1445063

Ikoja-Odongo, R. & Mostert, J. (2006). Information seeking behaviour: A conceptual framework. Retrieved from http://sajlis.journals.ac.za/pub/article/view/1112/1048

Hallmark, Julie. (2001). Information-Seeking Behavior of Academic Meteorologists and the Role of Information Specialists, Science & Technology Libraries. Retrieved from https://www.tandfonline.com/doi/abs/10.1300/J122v21n01_06

Paliwal, S., Bhardwaj, M. & Sharma, S. (2016). Information Needs and Information Seeking Behaviour of Faculty Members of Science & Technology. Retrieved from https://www.researchgate.net/publication/303402406_Information_Needs_and_Information_Seeking_Behaviour_of_Faculty_Members_of_Science_Technology_GBNagar_A_Study

# National Library Review: A Bibliometric Analysis of Articles Published for Five Years (2014-2018)

**R. D. Ananda Tissa#**

*Senior Assistant Librarian, Gampaha Wickramarachchi Ayurveda institute,University of Kelaniya*
*rdatissa@gmail.com*

**H. W. Kusala Sajeewani**

*Assistant Director, National Library & Documentation Services Board, Sri Lanka*
*kusalasajeewani@gmail.com*

## ABSTRACT

Library service in Sri Lanka began as a community contribution with a religious origin. Origin of library profession commenced in 19 century However, it was developed as a highly accepted profession in 20th century. Discusses the value to the profession of research conducted by librarians, who, however, have to weigh these benefits against the time and effort spent in writing for publication.

Librarianship is mostly recognized through the compilation of academic articles and research skills. This research was designed to study the growth of library and information science literature last five decade with particular reference to National Library Review (NLR).

The study was based on secondary sources and explanatory in nature. Over 29 articles published by various authors from 2014 to 2018 in this NLR were considered in this review. An extensive review of the articles was carried out from a wide range of perspectives including the categorization of the articles and the identification of the related branches etc.

The main objective of this study is to survey the growth of Library and Information Science (LIS) literature over 50 years in Sri Lanka. Other objectives are to investigate the direction of LIS field, list of the subject, identification of languages, length and citation of articles and domain of library services. The core of library science including subject field, quality, quantity, coverage, innovations and other disciplines.

The amalgamation of information on subject specialists of LIS appreciation and awarding of academic contribution of library professions, providing opportunities for promoting professional qualifications planning a convention for policies of salaries according to academic and research skills and should be given due prominence in publications are suggested.

**Keywords :** Library Literature, Library Profession, Librarianship

# ජාතික පුස්තකාල විමර්ශන සඟරාවේ වසර පහක (2014-2018) ප්‍රකාශිත ලිපි පිළිබඳ සංඛ්‍යාන විශ්ලේෂණය

## හැඳින්වීම

පුස්තකාල ප්‍රවෘත්ති සඟරාවේ වූ ප්‍රවෘත්තිමය තොරතුරු හේතුවෙන් ශාස්ත්‍රීය හා ගුණාත්මක තත්ත්වය ආරක්ෂා කර ගැනීම අරමුණු කර ගෙන 2014 වර්ෂයේ ජාතික පුස්තකාල විමර්ශන සඟරාව උසස් මට්ටමේ ප්‍රකාශනයක් වශයෙන් සංස්කරණය කරනු ලබයි. විද්වත් ප්‍රකාශනයක් වශයෙන් පවත්වා ගෙන යාමට සංස්කාරකවරු කටයුතු කරන අතර ප්‍රකාශිත ලිපි ද විවිධ විද්වතුන්ගේ විමර්ශනයන් හා නිරීක්ෂණයන් තෝරා ගනු ලැබේ.

## අධ්‍යයනයේ අරමුණු

ශ්‍රී ලංකාවේ පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රයෙහි පසුගිය වසර 50 දී ප්‍රකාශයට පත්කරන ලද විද්වත් ප්‍රකාශන හා වෙනත් ශාස්ත්‍රීය ප්‍රකාශන පිළිබඳ සූචියක් නිර්මාණය කිරීම මූලික අරමුණකි. ඉතා වැදගත් ප්‍රකාශන පළකර තිබුණ ද ඇතැම් ඒවා පිළිබඳ විධිමත් ප්‍රචාරයක් නොමැති නිසා ද, සමහර ප්‍රකාශන නිසි පරිදි සංස්කරණය නොකිරීම නිසා ද ඒවායෙන් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබෙන තත්ත්වයක් පෙන්නුම් කෙරෙන හෙයින් ඒවා පිළිබඳව දැනුවත් කිරීම තවත් අරමුණක් විය.

## පර්යේෂණ ක්‍රමවේදය

ජාතික පුස්තකාල විමර්ශන ප්‍රකාශයට පත්කිරීමට අදාළ මූලික තොරතුරු පිළිබඳ පර්යේෂණාත්මක විශ්ලේෂණයක් මෙම අධ්‍යයනයට පාදක වී ඇත. අධ්‍යයනයේ අරමුණු අනුව ප්‍රකාශිත සඟරා ප්‍රමාණය, අර්ධ වාර්ෂික, වාර්ෂික හෝ දෙවාර්ෂික වශයෙන් ද, වෙළුම්, කලාප හෝ අංක වශයෙන් ප්‍රකාශනවල තත්ත්වය ද විස්තරාත්මකව සඳහන් කෙරේ. අදාළ කාල සීමාවේ වැඩිම ලිපි ප්‍රමාණයක් හා අඩුම ලිපි ප්‍රමාණයක් ප්‍රකාශිත වර්ෂ, එකී ලිපිවල විෂය අන්තර්ගතය, මූලාශ්‍ර භාවිතය ආදි කරුණු ශාස්ත්‍රීය පසුබිමක් යටතේ විශ්ලේෂණය කෙරේ.

## දත්ත විශ්ලේෂණය

එමෙන් ම, ප්‍රකාශයට පත්කර ඇති ලිපිවල අන්තර්ගත විෂය පරාසය පුස්තකාල හා විඥාපන විද්‍යාවේ නිරාවරණය කෙරෙන විෂය අංශයන් ද මෙම අධ්‍යයනයේ දී විවරණය කෙරේ. මෙම අධ්‍යයනයට පාදක වූ මූලික තොරතුරු අදාළ කාල සීමාව නියෝජනය වන පරිදි

එක් එක් සඟරාවල සඳහන් වූ අයුරින් මෙහි දී වගු අංක 1 යටතේ විශ්ලේෂණය කෙරේ.

වගු අංක 01 ඃ අදාළ කාල සීමාව නියෝජනය වන පරිදි එක් එක් සඟරාවල සඳහන් මූලික තොරතුරු

| ප්‍රකාශිත වර්ෂ | | වෙළුම, කලාප හෝ අංක | ලිපි ගණන | කාල පරාසය |
|---|---|---|---|---|
| 1 | 2014 | වෙළුම 1, අංක 1 | 7 | ජනවාරි - ජූනි |
| 2 | 2014 | වෙළුම 1. අංක 2 | 8 | ජූලි - දෙසැම්බර් |
| 3 | 2015 | වෙළුම 2, අංක 1 හා 2 | 7 | ජනවාරි - ජූනි හා ජූලි - දෙසැම්බර් |
| 4 | 2018 | වෙළුම 3, අංක 1 හා 2 | 7 | ජනවාරි - ජූනි හා ජූලි - දෙසැම්බර් |
| එකතුව | | | 29 | |

මූලාශ්‍රය ඃ 2014 සිට 2018 දක්වා ප්‍රකාශිත ජාතික පුස්තකාල විමර්ශන සඟරා කලාප

## භාෂා මාධ්‍යය අනුව ප්‍රකාශිත ලිපි සංඛ්‍යාව

වගු අංක 2හි සඳහන් වන අයුරෙන් 2014 - 2018 කාල සීමාවේ දී ප්‍රකාශිත ලිපි 29 භාෂා මාධ්‍ය වශයෙන් විශ්ලේෂණය කිරීමේ දී සිංහල ලිපි 12ක්, දෙමළ මාධ්‍ය ලිපි 4ක් හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ප්‍රකාශිත ලිපි 13ක් වශයෙන් තොරතුරු අනාවරණය වේ. වසර 5ක් ඇතුළත දෙමළ මාධ්‍යයෙන් ශාස්ත්‍රීය ලිපි සම්පාදනයේ අඩු ප්‍රවණතාවක් දර්ශනය වේ. මාධ්‍ය අනුව කෙරෙන වර්ගීකරණයේ දී දක්නට ලැබෙන දත්ත පහත දැක්වේ.

වගු අංක 2 ඃ2014 - 2010 කාලසීමාවේ ප්‍රකාශිත ලිපිවල භාෂා මාධ්‍යය

| ප්‍රකාශිත වර්ෂ | | වෙළුම, කලාප හෝ අංක | මුළු ගණන | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | කාල පරාසය |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2014 | වෙළුම 1, අංක 1 | 7 | 4 | 1 | 2 | ජනවාරි - ජූනි |
| 2 | 2014 | වෙළුම 1. අංක 2 | 8 | 4 | 1 | 3 | ජූලි - දෙසැම්බර් |
| 3 | 2015 | වෙළුම 2, අංක 1 හා 2 | 7 | 3 | 1 | 3 | ජන. - ජූනි හා ජූලි - දෙසැ. |
| 4 | 2018 | වෙළුම 3, අංක 1 හා 2 | 7 | 1 | 1 | 5 | ජන. - ජූනි හා ජූලි - දෙසැ. |
| එකතුව | | | 29 | 12 | 4 | 13 | |

මූලාශ්‍රය ඃ 2014 සිට 2018 දක්වා ප්‍රකාශිත ජාතික පුස්තකාල විමර්ශන සඟරා කලාප

## ශාස්ත්‍රීය ලිපියක දිග හෙවත් පිටු ප්‍රමාණය අනුව විශ්ලේෂණය

ශාස්ත්‍රීය ලිපියක් කෙතරම් පිටු ගණනක් යටතේ විස්තරතාත්මකව සඳහන් වේ ද යන්න මෙහි සඳහන් වේ. සඟරා හතරක ප්‍රකාශිත ලිපි 29 ක තොරතුරු විශ්ලේෂණයේ දී පිටු 39 ක් දිග දීර්ඝම ලිපිය පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක විස්තර පහත සඳහන් වේ.

Nicholson, Denise Rosemary

Nicholson, Denise Rosemary (2015), Seeking balance in copyright law for persons with sensory disabilities, National Library Review, Colombo : National Library and Documentation Services Board, Vol. 2, No. 1 & 2, January-June & July-December, p. 111 – 149

දෙවැනි හා තෙවැනි ලිපි පිළිවෙළින් පිටු 29ක ලිපිය වෙළුම 2, අංක 1 හා 2හි Commercial versus open access : use of e-resources among engineering academics in Sri Lanka (p. 74 – 102) වශයෙන් ද, තෙවැන්න වූ පිටු 27ක ලිපිය 2014 වෙළුම 1, කලාපය 1 විදෙස්ගත අපේ වෙද පුස්කොළ පොත් (පිටු 1-27) වශයෙන් සඳහන් වේ.

අවම පිටු ගණනක් සහිත ලිපිය පිටු 8ක ප්‍රකාශිත ලිපියකි. එය 2014 වෙළුම 1. අංක 2 පිටු අංක 111-118හි National social media regulations for information services providers සඳහන් වේ. පිළිවෙළින් දෙවැනියට හා තෙවැනියට අඩුම පිටු ගණනක් සඳහන් වන්නේ පිටු 9ක් හා 10ක් වශයෙන් සඳහන් වන ලිපි දෙකකි. අඩුම පිටු ගණනක් ඇති ලිපියට අදාළ විස්තර මෙහි සඳහන් කෙරේ.

ලිපියක් ප්‍රකාශයට පත්කර ඇති පිටු පරාසය පිළිබඳ විශ්ලේෂණාත්මක තොරතුරු වගු අංක 3හි දැක්වෙන පරිදි අදාළ දත්ත පරිමාණයන් 8ක් යටතේ විශ්ලේෂණය කෙරේ. මෙහි දක්නට ලැබෙන විශේෂත්වය වන්නේ සෑම ලිපියක්ම ශාස්ත්‍රීය පසුබිමක් යටතේ විද්‍යාත්මක ක්‍රමවේදයනට අනුකූලව සංස්කරණය කර ප්‍රකාශයට පත්කිරීමට කිසියම් සාධනීය ප්‍රයත්නයන් අනුගමනය කර ඇති බව නිරීක්ෂණය වීමයි.

වගු අංක 3 : ලිපියක් ප්‍රකාශයට පත්කර ඇති පිටු පරාසය

| ප්‍රකාශිත වර්ෂ | | වෙළුම, කලාප හෝ අංක | ලිපි ගණන | පිටු ගණන | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 1-5 | 6-10 | 11-15 | 16-20 | 21-25 | 26-30 | 31-35 | 36-40 |
| 1 | 2014 | වෙ. 1, අංක 1 | 7 | - | - | 3 | 1 | 1 | 2 | - | - |
| 2 | 2014 | වෙ. 1. අංක 2 | 8 | - | 2 | 1 | 1 | 4 | - | - | - |
| 3 | 2015 | වෙ. 2, අංක 1 හා 2 | 7 | - | - | 1 | 4 | 1 | - | - | 1 |
| 4 | 2018 | වෙ. 3, අංක 1 හා 2 | 7 | - | 1 | 1 | 4 | 1 | - | - | - |
| එකතුව | | | 29 | - | 3 | 6 | 10 | 7 | 2 | - | 1 |

## මූලාශ්‍ර අධ්‍යයනය හා සාහිත්‍ය විමර්ශන අනුව විශ්ලේෂණය

ශාස්ත්‍රීය ලිපියක් ලිවීම සඳහා පාදක වන සාහිත්‍යමය මූලාශ්‍ර විමර්ශනය නිවැරැදි තොරතුරු අධ්‍යයනයේ දී ශාස්ත්‍රීය කාර්යභාරයක් ඉටුකරයි. ඒ සඳහා භාවිත වාරික ප්‍රකාශන, ශාස්ත්‍රීය කෘති, පර්යේෂණ පත්‍රිකා, වෙබ් පිටු, විමර්ශන කෘති, රාජ්‍ය ප්‍රකාශන, පුවත්පත් වාර්තා ආදී මූලාශ්‍ර පිළිබඳ තොරතුරු වගු අංක 4හි දැක්වෙන පරිදි අදාළ දත්ත ක්ෂේත්‍ර 8ක් යටතේ විශ්ලේෂණය කෙරේ.

වගු අංක 4 : ලබාගත් ලිපි සඳහා පාදක වන සාහිත්‍යමය මූලාශ්‍ර ප්‍රමාණයන්

| ප්‍රකාශිත වර්ෂ | | වෙළුම, කලාප හෝ අංක | ලිපි ගණන | මූලාශ්‍ර ගණන | විමර්ශන මූලාශ්‍ර ගණන | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 1-5 | 6-10 | 11-15 | 16-20 | 21-25 | 26-30 | 31-35 | 36 < |
| 1 | 2014 | වෙ. 1, අංක 1 | 7 | 53 | 4 | 2 | - | 1 (19) | - | - | - | - |
| 2 | 2014 | වෙ. 1. අංක 2 | 8 | 103 | - | 4 | 2 | 2 (20) | - | - | - | - |
| 3 | 2015 | වෙ. 2, අංක 1 හා 2 | 7 | 99 | 2 | 2 | 2 | - | - | - | - | 1 (54) |
| 4 | 2018 | වෙ. 3, අංක 1 හා 2 | 7 | 100 | - | 2 | 2 | 2 | - | 1 (3) | - | - |
| එකතුව | | | 29 | 355 | 6 | 10 | 6 | 5 | - | 1 | - | 1 |

ඉහත වගුවෙහි දැක්වෙන පරිදි 54ක් වූ වැඩිම විමර්ශන මූලාශ්‍ර සංඛ්‍යාවක් භාවිත කර ඇත්තේ Seeking balance in copyright law for persons with sensory disabilities ලිපිය සඳහා ය. මෙම ලිපියට අදාළ තොරතුරු වැඩිම පිටු ගණනක ඇති ලිපිය යටතේ විස්තරාත්මකව සඳහන් කර ඇති හෙයින් නැවත මෙහි සඳහන් කර නොමැත. ලිපි 29ක ඇති මූලාශ්‍ර 355 ප්‍රතිශතයක් වශයෙන් වගු අංක 5 යටතේ මෙසේ විශ්ලේෂණය කෙරේ.

වගු අංක 5 : මූලාශ්‍ර විශ්ලේෂණය

| ප්‍රකාශිත වර්ෂ | | වෙළුම, කලාප හෝ අංක | ලිපි | මූලාශ්‍ර ගණන | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 1 | 2014 | වෙළුම 1, අංක 1 | 7 | 53 | 14'9 |
| 2 | 2014 | වෙළුම 1. අංක 2 | 8 | 103 | 29'0 |
| 3 | 2015 | වෙළුම 2, අංක 1 හා 2 | 7 | 99 | 27'9 |
| 4 | 2018 | වෙළුම 3, අංක 1 හා 2 | 7 | 100 | 28'1 |
| එකතුව | | | 29 | 355 | 100 |

## විෂය අනුව ලිපි වර්ගීකරණය

ඩිවී දශම වර්ගීකරණයේ 23 වන සංස්කරණය අනුව වර්ගීකරණ සැලැස්ම සම්පාදනය කෙරිණි. 000 පරිගණක විද්‍යාව, තොරතුරු හා සාමාන්‍ය කෘති යටතේ පර්යේෂණ ක්‍රම සඳහා

අංකයක් වර්ගීකරණ සැලැස්ම ඇසුරෙන් නිර්මාණය කෙරිණි. අනෙකුත් සියලු විෂයයන් 020 සිට 029 දක්වා පුස්තකාල හා විඥාපන විද්‍යාව වෙනුවෙන් වෙන්කර ඇති වර්ග අංක සුදුසු පරිදි සංස්කරණය කර ප්‍රකාශිත ලිපි සියල්ල සඳහා සුදුසු පරිදි වර්ග අංක සපයා වගු අංක 6 යටතේ දක්වා ඇත.

වගු අංක 6 : විෂය අනුව ලිපි වර්ගීකරණය

| අංකය | විෂය අනුව ලිපි වර්ගීකරණය | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
|---|---|---|---|---|
| 001.42 | පර්යේෂණ ක්‍රම | - | - | 1 |
| 020 | පුස්තකාල විද්‍යාවේ මූලිකාංග, පුස්තකාල සම්පත්, සැලසුම් හා ප්‍රමිති | 2 | 1 | 2 |
| 023 | පුද්ගල කළමනාකරණය | 1 | - | - |
| 025 | පුස්තකාලය, ලේඛනාගාර, තොරතුරු මධ්‍යස්ථාන මෙහෙයුම් | 2 | 1 | 7 |
| 026 | නියත විෂයයන් සඳහා වෙන් වූ පුස්තකාල, ලේඛනාගාර මධ්‍යස්ථාන | 1 | - | - |
| 027 | සාමාන්‍ය පුස්තකාල, ලේඛනාගාර, තොරතුරු මධ්‍යස්ථාන | 3 | 2 | 1 |
| 028 | කියවීම සහ වෙනත් තොරතුරු මාධ්‍ය | 1 | - | 1 |
| 029 | වෙනත් විෂයන් | 2 | - | 1 |
| එකතුව | 12 | 4 | 13 | |

## නිගමන හා යෝජනා

- 2014-2018 කාල සීමාවේදී ලිපි 29ක් ප්‍රකාශ වී ඇත.
- පර්යේෂණ ක්‍රමවේදය, තොරතුරු තාක්ෂණය, තොරතුරු කුසලතා හා පුස්තකාල ස්වයංක්‍රීයකරණය, පුද්ගල කළමනාකරණය, වර්ගීකරණය, සූචිකරණය, පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය, කියැවීම ප්‍රවර්ධනය, පුස්තකාල වර්ග විෂය යටතේ පුස්තකාල විද්‍යා සාහිත්‍ය වර්ධනය සිදු වී ඇත. භාෂා මාධ්‍ය වශයෙන් සිංහල මාධ්‍ය ලිපි 12ක්, දෙමළ මාධ්‍ය ලිපි 4ක් හා ඉංග්‍රීසි මාධ්‍ය ලිපි 13ක් වශයෙන් ප්‍රකාශිත ය. වැඩිම ලිපි ප්‍රමාණයක් ප්‍රකාශයට පත්වී ඇත්තේ 2014 වර්ෂයේ වෙළුම 1. අංක 2 කලාපයේ ය. එය සංඛ්‍යාත්මකව 8කි. පිටු 39ක දිගම ශාස්ත්‍රීය ලිපිය 2015 වර්ෂයේ ප්‍රකාශිත වෙළුම 2 කලාපය 1 හා 2හි සඳහන් වේ. අඩුම පිටු ගණන 8ක් වශයෙන් ප්‍රකාශිත ලිපි ගණන 1කි. එකී ලිපිය 2014 වෙළුම 1 අංක 2හි සඳහන් වේ. අඩුම පිටු ගණනක් වශයෙන් සඳහන් වන අනෙකුත් ලිපි පිළිවෙළින් පිටු 9 හා 10ක් වශයෙන් එහි තත්ත්වය ද මෙහි දී විශ්ලේෂණය කෙරිණි.

ඉතා සරලව මේ කරුණු සම්පිණ්ඩනය කරන්නේ නම්, වෘත්තීයවේදීන් වශයෙන් ක්‍රියාකිරීම හා වෘත්තීය සංවර්ධනය පිණිස අනලස්ව කටයුතු කිරීම ද, එබඳු දියුණුවට පත් පුස්තකාල විද්‍යාවේදීන් ආදර්ශයට ගැනීම ද අත්‍යවශ්‍ය වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

තිස්ස, ආර්. ඩී. ආනන්ද . (2019). ශ්‍රී ලංකා පුස්තකාල විමර්ශන සඟරාවේ පනස්හත් වසරක (1962-2018) ලිපි පිළිබඳ සංඛ්‍යාන විශ්ලේෂණය. (A Bibliometric Analysis of articles published for Fifty seven Years (1962-2018) in Sri Lanka Library Review Journal), Proceeding of the 15th National Conference on Library and Information Science, 27th June, Colombo : Sri Lanka Library Association, p. 45 - 53

Gunasekera, Chamani .(2010). Styles of bibliographical citations: Sri Lanka Library Review. Sri Lanka Library Review, Colombo : Sri Lanka Library Association, Vol. 24, June, p. 95 - 106

Jayatissa, L. A. (2000). Citation analysis and user studies : its importance in library management, Library News, Colombo : The Newsletter of the National Library of Sri Lanka, Vol. 21, No. 1, Jan.-March, p. 67 - 72

Perera, Nanda ; Talagala, Deepali. (2003). Sri Lanka Library Review (New Series) : a bibliometric analysis.Sri Lanka Library Review, Colombo : Sri Lanka Library Association, Vol. 17, June, p. 41 - 51

# Agricultural Information Needs of the Rural Farmers in Kurunegala District in Sri Lanka

**B.G. Rangani#**

*B.A Candidate, Department of library and Information Science, University of Kelaniya*
*geethika94@gmail.com*

**A.G.R.P. Kumara**

*Assistant Librarian, Batticaloa Regional Center, The Open University of Sri Lanka*
*kumaraagrpk123@gmail.com*

## ABSTRACT

Information is considered as a fundamental resource for the human and their education and other activities including agriculture. However, presently in Sri Lanka there is an ongoing problem with farmers' up-to-date knowledge on agriculture which affects badly on their agricultural products. Hence, his study aimed to investigate the information needs especially agricultural information needs of rural farmers in Sri Lanka.

This study employed qualitative research methodology and used survey method as a research method. Cluster sampling method has been used to select a study sample which included 100 farmers who lives in Walpothwewa, Dambukele, Weerapokuna, Puwakgahakadawala, Koonkadawala and Kiniyama in Bingiriya secretariat division in Kurunegala district. Primary date for this study were collected through structured questionnaires and semi-structured interviews. How farmers use different sources of information to fulfill their information needs are also observed by the researcher.

This study found that farmers require various types of agricultural information. They are information about varieties of new seeds, pesticide management, livestock management, diseases, and fertility of soil. This study further identified that the rural farmers used some of the common sources of agricultural information such as television, Radio, Newspaper, Leaflet, Agricultural exhibitions and mobile apps to fulfill their information needs. Based on the study findings, it is confirmed that there is a huge demand for updated agricultural information for the rural agricultural community in Sri Lanka. However, due to the lack of relationships between farmers and agricultural officers, farmers not satisfied with getting information via agricultural officers and other relevant authorities.

This study recommended that government should take necessary step to improve farmers' information seeking behavior by conducting workshop, lectures, and active

agricultural societies. This study further suggested that elect efficient and talent officials and thereby develop good relationship with farmers to provide relevant information when necessary. Moreover, electronic media can also play a vital role for fulfilling agricultural information needs of rural farmers in Sri Lanka.

**Keywords:** Information needs, Rural Famers, Agriculture, Information Sources

# ග්‍රාමීය ගොවීන්ගේ කෘෂිකාර්මික තොරතුරු අවශ්‍යතා පිළිබඳ අධ්‍යයනයක් : කුරුණෑගල දිස්ත්‍රික්කය ආශ්‍රිතව

## හැඳින්වීම

සමාජීය පුද්ගලයන් ගත් කළ සමාජීය ජීවිතය තුළ විවිධ වූ අවශ්‍යතාවයන් ඇති වේ. යම් දෙයක් කෙරෙහි පවතින්නා වූ වුවමනා සහිත තත්ත්වය සරලව අවශ්‍යතාවය ලෙස අර්ථ දැක්විය හැකිය. පුද්ගලයකු හට ඇති විය හැකි විවිධ වූ අවශ්‍යතා අතුරින් තොරතුරු ලබා ගැනීම නැමති අවශ්‍යතාවයට හිමි වනුයේ සුවිශේෂී වූ ස්ථානයකි.

"කිසියම් වූ පුද්ගලයකු විසින් තොරතුරු සෙවීමේ ක්‍රියාවක නිරතව යම් තොරතුරක් සොයයි ද, යම් තොරතුරු සෙවීමක් අරමුණු කරයි ද, එය තොරතුරු අවශ්‍යතාවය නම් වේ." (Devi සහ Dlamini, 2014, 3)

වර්තමානයේ ''තොරතුරු'' යන්න ඉතා ප්‍රබල අවශ්‍යතාවයක් බවට පත්ව තිබේ. තොරතුරු සමාජයක් තුළ වෙසෙමින් තොරතුරු මත පදනම්ව සියලුම අර්ථ ක්‍රමයන්හි සංවර්ධනයක් අපේක්ෂා කරන අතර, කෘෂිකාර්මික ක්ෂේත්‍රය ද ඉන් අත්මිදී නොමැත. කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ දැනුම තොරතුරු හා පණිවිඩ හුවමාරුවේ දී කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය ඉටු කරනු ලබන්නේ ප්‍රධාන කාර්යභාරයකි. එනම්, ගොවීන්ගේ නිෂ්පාදන හා අලෙවිය වර්ධනය කර ගැනීම සඳහා උපදේශනයෙන් හා මඟ පෙන්වීමෙන් සහය වීම කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවෙන් සිදු කෙරේ (Adams, 1982). මෙලෙස කෘෂිකාර්මික තොරතුරු පිළිබඳව දැඩි අවශ්‍යතාවයක් ග්‍රාමීය ජනතාවට පවතී. ඒ අනුව කෘෂිකර්මය හා තොරතුරු පදනම් කර ගනිමින් ග්‍රාමීය ප්‍රදේශවල ගොවි ජනතාවගේ එම කෘෂිකාර්මික තොරතුරු අවශ්‍යතා සම්බන්ධව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය හරහා සිදුවේ.

## පර්යේෂණ අරමුණු

- ග්‍රාමීය ජනතාවගේ කෘෂිකාර්මික තොරතුරු අවශ්‍යතා හඳුනා ගැනීම
- ග්‍රාමීය ජනතාවට අවශ්‍යය කරන කෘෂිකාර්මික තොරතුරු වල ස්වාභාවය සහ තොරතුරු වර්ග හඳුනා ගැනීම
- ග්‍රාමීය ජනතාව කෘෂිකර්මාන්තයේ දී තම තොරතුරු අවශ්‍යතාවය ඉටු කර ගැනීම සඳහා භාවිත කරන තොරතුරු මූලාශ්‍ර හඳුනා ගැනීම.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා සමීක්ෂණ පර්යේෂණ ක්‍රමය යොදා ගෙන ඇත. නියැඳිය වශයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගොවි ජනපද 10 ක් අතුරින් ගොවීන් 100 දෙනෙක් යොදා ගන්නා ලදී. දත්ත එකතු කිරීමේදී ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලී සහ සම්මුඛ සාකච්ඡා යොදා අතර දත්ත විශ්ලේෂණය සඳහා MS Excel මෘදුකාංගය භාවිත කරන ලදී. එම දත්තයන් ඉදිරිපත් කිරීම සඳහා ප්‍රස්තාර සහ වගු භාවිත කරන ලදී.

## දත්ත විශ්ලේෂණය

*යෙදෙන්නා වූ කෘෂිකාර්මික අංශය හෝ අංශ*

ප්‍රස්ථාර අංකඃ 01 යෙදෙන්නා වූ කෘෂිකාර්මික අංශය හෝ අංශ




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2018

ප්‍රශ්නාවලිය මඟින් අධ්‍යයනය කරන ලද තොරතුරු අනුව කෘෂිකර්මාන්තයේ යෙදෙන පිරිසෙයින් ඔවුන් කෘෂිකර්මාන්තයේ යෙදෙන්නනේ කුමන කර්මාන්තය ඔස්සේ ද යන්න මෙම ප්‍රස්ථාරයෙන් දැක්වේ. නියැඳියෙහි කර්මාන්ත 10 ක් දක්වා ඇත. ප්‍රස්ථාරයට අනුව වැඩිම ප්‍රමාණයක් යෙදෙන කෘෂිකාර්මික අංශය වන්නේ වී ගොවිතැන යි. එහි ප්‍රතිශතය 76% කි. බොහෝ විට ජනයා වී වගාව ප්‍රමුඛ කොට අනෙකුත් කර්මාන්ත සිදු කරන ලදී. සත්ත්ව පාලනය හා ගෙවතු වගාව සමාන ප්‍රතිශතයකට දක්වා ඇත.

## කෘෂිකාර්මික කටයුතුවල යෙදීමට පෙර තොරතුරු අවශ්‍යතා

කෘෂිකාර්මික කටයුතුවල යෙදීමට පෙර අවශ්‍ය වන දැනුම හා අවබෝධය ලබා ගැනීම සම්බන්ධව තොරතුරු ප්‍රස්තාර අංක 02න් ලබා ගත හැකිය. 62% ක ප්‍රතිශතයක් ඉතා වැදගත් බවටත්, 18% වැදගත් තොරතුරු අවශ්‍යතාවයක් බවටත් දක්වා ඇත. දෙවනුව ප්‍රධාන ගැටලුවක්ව පවතින ජල කළමනාකරණය සඳහා තොරතුරු ලැබීම වැදගත් බව 58% ක ප්‍රතිශතයක් පෙන්වා දී ඇත. ජල කළමනාකරණයේ දී එය වැදගත් නොමැති බවට 10% දෙනෙකු ප්‍රතිචාර දක්වා ඇත. මේ ආකාරයට ගොවින්ගේ පෙර තොරතුරු අවශ්‍යතාවය සම්බන්ධයෙන් විශ්ලේෂණාත්මක අවබෝධයක් ලබා ගත හැකි ය. නව ප්‍රභේද පිළිබඳව පුහුණු කිරීම සඳහා ගොවින්ගේ දැඩි උනන්දුවත් පවතින බව මෙයින් පැහැදිලි වේ.

ප්‍රස්ථාර අංක 02: කෘෂිකාර්මික කටයුතු වල යෙදීමට පෙර තොරතුරු අවශ්‍යතා




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2018

## කෘෂිකාර්මික කටයුතු වල යෙදීමෙන් පසු තොරතුරු අවශ්‍යතා

කෘෂිකාර්මික කටයුතු වල යෙදීමෙන් පසු ග්‍රාමීය ජනයාට අවශ්‍යවන තොරතුරු පිළිබඳව අධ්‍යයනයේ දී අවධානය යොමු කරන ලදි. පළිබෝධ කළමනාකරණය පිළිබඳව තොරතුරු ඉතා වැදගත් අත්‍යවශ්‍ය බවට පත් වී ඇති බව ඔවුන්ගේ ප්‍රතිචාර මඟින් පැහැදිලි වේ. 72% ක් ඉතා වැදගත් තොරතුරක් බවට දක්වන ලද අතර වැදගත් තොරතුරක් ලෙස 16%ක් දක්වයි. කෘෂිකර්මාන්තයේදී රෝග පැතිරීයාම ප්‍රධාන ගැටලුවක් බවට පත් වී ඇති බැවින් එම තොරතුරු 66% දෙනෙකු අවශ්‍ය බව දක්වයි. වී වගාව සම්බන්ධයෙන් වර්තමානයේ රෝග විශාල ලෙස පැතිරී යාම නිසා එම තොරතුරු අවශ්‍යතාවය ඔවුන්ට තදින්ම දැනී ඇත.

ප්‍රස්ථාර අංක 03 : කෘෂිකාර්මික කටයුතු වල යෙදීමෙන් පසු තොරතුරු අවශ්‍යතා




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2018

## කෘෂිකාර්මික තොරතුරු මූලාශ්‍රවල වැදගත්කමෙහි ස්වභාවය

ප්‍රස්ථාර අංක 04 : මුද්‍රිත මූලාශ්‍ර




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2018

තොරතුරු ලබා ගැනීමේ මූලාශ්‍ර අතර විද්‍යුත් මූලාශ්‍රවලටත් වඩා මූලිකත්වය ලැබෙන්නේ මුද්‍රිත මූලාශ්‍ර වලටය. මෙහි කෘෂිකාර්මික ජනතාවගේ එම තොරතුරු මූලාශ්‍ර වල පවතින වැදගත්කමෙහි ප්‍රමුඛතාවය දක්වා ඇත. දැන්වීම් විශේෂයෙන් වැදගත් බව ඔවුන් දක්වයි. දැන්වීම් 44% ක් වැදගත් බව දක්වන අතර 36% ක් සාමාන්‍ය වශයෙන් වැදගත් බව දක්වයි.

අත් පත්‍රිකා ඉතා වැදගත් ලෙස 8% ක් දැක්වූ අතර, සාමාන්‍ය වශයෙන් වැදගත් එකක් ලෙසට 46% ක් ප්‍රතිචාර දක්වා ඇත. අත් පත්‍රිකාවල විශේෂත්වය වන්නේ එහි වැදගත් නොවන ප්‍රතිශතය 8% ක් වැනි අඩු ප්‍රතිශතයක් ගැනීමයි.

සාමාන්‍යයෙන් කෘෂිකාර්මික තොරතුරු ලබා ගැනීමේදී පුවත් පත් ලිපි වැදගත් වේ. එහි වැදගත්කමෙහි ප්‍රමුඛතාවය 44% කි. 44% ක් සාමාන්‍ය වශයෙන් වැදගත් බවට ප්‍රතිචාර දක්වයි. සාමාන්‍ය පරිදි 12%ක ප්‍රමාණයකට ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතා සඳහා පුවත්පත් හා ලිපි අවශ්‍ය නොවන බවට තහවුරු කර ඇත. ශ්‍රී ලංකාව වැනි රටක ඉතා ඉක්මනින් සහ අඩු වියදමකින් පුවත්පත් මගින් තොරතුරු ලබා ගත හැක.

ප්‍රස්ථාරයේ දැක්වෙන පරිදි ඉතා වැදගත් තොරතුරු මූලාශ්‍රයක් ලෙස වැඩිම ප්‍රතිශතයක් ප්‍රතිචාර දක්වා ඇත්තේ කෘෂිකාර්මික ප්‍රදර්ශන සඳහා වේ. එහි ප්‍රතිශතය 28% ක් වේ. කෘෂිකාර්මික ප්‍රදර්ශන වැදගත් බව 60% ක් දක්වා ඇත. සමස්ථයක් ලෙස අදාල පිරිසෙන් 12% ක් කෘෂිකාර්මික තොරතුරු වැදගත් නොවන බවට ප්‍රතිචාර දක්වා තිබේ. ප්‍රශ්නාවලී සඳහා සියළුම දෙනා තොරතුරු ලබා දුන් අතර එයින් මුද්‍රිත මූලාශ්‍ර සම්බන්ධව ඔවුන්ට පවතින අවබෝධය සහ ඔවුන් ඒවා භාවිත කරන ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස ලබා ගත හැකිය.

ප්‍රස්ථාර අංක 05: විද්‍යුත් මූලාශ්‍ර




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2018

මුද්‍රිත මූලාශ්‍ර මෙන්ම වැදගත් තොරතුරු සපයන මූලාශ්‍රයක් ලෙස විද්‍යුත් මූලාශ්‍ර හැඳින්විය හැක. මෙහි දී කෘෂි ජනතාව නිතරම භාවිත කරන විද්‍යුත් මූලාශ්‍ර ත්‍රිත්වයක් ඉදිරිපත් කර

ඇත. ඒ රූපවාහිනිය, ජංගම දුරකථනය, ගුවන්විදුලිය යන මූලාශ්‍ර වේ. මෙම මාධ්‍ය භාවිත කිරීම සහ භාවිතයේ වැදගත්කම ප්‍රශ්නාවලියෙන් විමසන ලදී.

එහිදී 58%ක් රූපවාහිනිය මූලාශ්‍රයක් වශයෙන් වැදගත් බව සඳහන් කර ඇති අතර කෘෂිකාර්මික ජනතාව බොහෝ විට ජාතික රූපවාහිනිය නරඹන බව ද සඳහන් කර තිබේ.රූපවාහිනිය තොරතුරු මූලාශ්‍රයක් ලෙස භාවිත කිරීම සුදුසු නොවන බව 4% ක් වැනි ඉතා අඩු ප්‍රතිශතයක් අදහස් දක්වන ලදී. එයින් පැහැදිලි වන්නේ රූපවාහිනිය වැදගත් තොරතුරු මූලාශ්‍රයක් වන බවයි.

තොරතුරු ලබා ගැනීමේ දී ජංගම දුරකථන ඉතා වැදගත් බව 26% ක් සාමාන්‍ය ලෙස වැදගත් තොරතුරු මූලාශ්‍රයක් ලෙස 24% ක් ප්‍රතිචාර දක්වා තිබේ. එයින් සමස්ථයක් ලෙස 80% ක් ජංගම දුරකථන තොරතුරු මූලාශ්‍රයක් ලෙස වැදගත් වන බව සඳහන් කර ඇති අතර එයින් ජංගම දුරකථන 20% ක් වැදගත් නොවන මූලාශ්‍රයක් බව පෙන්වා දී තිබේ.

ගුවන් විදුලිය සෑම නිවසකම පවතින තොරතුරු මූලාශ්‍රයක් ලෙස දැක්විය හැකිය. ගුවන් විදුලිය 36%ක් තොරතුරු මූලාශ්‍රයක් ලෙස ඉතා වැදගත් බව දක්වා ඇත. තොරතුරු මූලාශ්‍රයක් ලෙස භාවිත කිරීමේ දී හා ඔවුන් තොරතුරු ලබා ගැනීමේ දී එහි වැදගත්කම සාමාන්‍ය වශයෙන් ගත් විට 54% ක් වේ. මෙය සමස්ත ප්‍රමාණයෙන් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් වේ. එම නිසා තොරතුරු මූලාශ්‍රයක් ලෙස කෘෂි ජනතාව තොරතුරු ලබා ගැනීමට ගුවන්විදුලිය වැදගත් බව දක්වයි. තොරතුරු මූලාශ්‍රයක් ලෙස වැදගත් නොවන බව 10% ක ප්‍රතිශතයක් ප්‍රතිචාර දක්වා ඇත. මුද්‍රිත මූලාශ්‍ර සමග ගෙන බැලීමේ දී විද්‍යුත් මූලාශ්‍ර වැදගත් නොවන ප්‍රතිශතය මුද්‍රිත මූලාශ්‍ර වැදගත් නොවන ප්‍රතිශතයට වඩා අඩුය.

## කෘෂිකාර්මික කටයුතු වල තොරතුරු ලැබීම

ප්‍රස්ථාර අංක 06: කෘෂිකාර්මික කටයුතු වල තොරතුරු ලැබීම




තොරතුරු මූලාශ්‍ර මගින් මේ වන විටත් තොරතුරු ලැබෙනවාද නැද්ද යන්න සම්බන්ධව ප්‍රශ්නාවලී ආශ්‍රයෙන් ලබා ගන්නා ලද දත්ත හා සමීක්ෂණ අනුව තොරතුරු ලැබීම ගණනය කළ හැක. එහිදී තොරතුරු ලැබෙන බවට 44% ක් ප්‍රතිචාර දක්වන ලද අතර 56% ක් තොරතුරු

නොලැබෙන බවටද හෙතුන් සමග දක්වන ලදී. ඒ අනුව තොරතුරු මූලාශ්‍ර මඟින් ඔවුන්ට තව දුරටත් කාර්යක්ෂම ලෙස තොරතුරු සැපයීම වැදගත් බව පෙනේ.

## නිගමන

ග්‍රාමීය ජනතාවට අවශ්‍ය කෘෂිකාර්මික තොරතුරු අවශ්‍යතා හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. එහිදී ඔවුන්ගේ එම තොරතුරු අවශ්‍යතා ඉටු වනවා ද නැද්ද යන්න සොයා බැලූ අතර ඉන් ලැබූ නිගමනය වන්නේ ග්‍රාමීය ජනතාවගේ කෘෂිකාර්මික තොරතුරු අවශ්‍යතා තවමත් ඉටු නොවන බවයි. කෘෂිකාර්මික ක්ෂේත්‍රය පිළිබඳව සලකා බැලීමේදී වැඩිම ප්‍රමාණයක් නිරත වන කෘෂිකාර්මික අංශය වන්නේ වී ගොවිතැනයි. එම නිසා ඒ අදාල නිලධාරීන් කෘෂිකර්මාන්තයේ දී වී ගොවිතැන සඳහා වැඩි අවධානයක් යොමු කර ඔවුන්ට සේවාවන් සැපයිය යුතුයි.

- නව ප්‍රභේද පුහුණු කිරීම යන්න කෘෂිකාර්මික ග්‍රාමීය ජනතාවගේ තොරතුරු අවශ්‍යතාවයක් වන බව තහවුරු විය. නමුත් එම තොරතුරු අවශ්‍යතාවය නිසි ආකාරව ඉටු නොවේ.
- පොහොර බීජ ආදී යෙදවුම් ලබා දීම, ජල කළමනාකරණය පිළිබඳව තොරතුරු ලබා දීම, කෘෂිකාර්මික ජනතාවගේ තොරතුරු අවශ්‍යතා අතර වැදගත් වන බව තහවුරු විය.
- කෘෂි කර්මාන්තයට අවශ්‍යවන නිවැරදි යාවත්කාලීන තොරතුරු ගොවීන් වෙත ලබා දීම කෘෂිකර්මයට සම්බන්ධ රාජ්‍ය නිලධාරීන්ගේ වගකීමක් වුව ද එම වගකීම නිසි පරිදි ඉටු නොවන බව තහවුරු විය.
- ගොවීන් මුහුණදෙන තවත් ගැටලුවක් නම් වගාවන්ට රෝග පැතිරීයාම එම නිසා කෘෂිකර්මාන්තයේ දී රෝග පැතිරීයාම සම්බන්ධව ඔවුන්ට තොරතුරු අවශ්‍ය වේ. ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත වලට අනුව කෘෂිකර්මාන්තයේ දී වර්තමානයේ රෝග පැතිරීයාම විශාල ලෙස වැඩි වී ඇති බව තහවුරු වේ.
- කෘෂිකාර්මික තොරතුරු සපයන තොරතුරු මූලාශ්‍රයක් ලෙස පුස්තකාලය මඟින් හෝ තොරතුරු මධ්‍යස්ථාන මඟින් ලැබෙන පිටුවහල ඉතා අවම මට්ටමක පවතින බව අධ්‍යයනය මඟින් හෙළි විය.
- තොරතුරු මධ්‍යස්ථානයක් හෝ පුසතකාලයක් යම් කිසි ස්ථානයකට පිහිටුවන්නේ එම ප්‍රදේශයට උපරිම සේවාව සැපයීම සඳහා වේ. නමුත් ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල මහජන පුස්තකාල පිහිටුවා ඇති නමුත් ඒවායින් සතුටු දායක සේවාවක් ඉටු නොවේ. කෘෂිකාර්මික තොරතුරු අවශ්‍යතා ඉටු කර ගැනීමේ දී ද පුස්තකාල හෝ වෙනත් තොරතුරු මධ්‍යස්ථානයක් මඟින් සිදු වන්නේ අල්ප සේවාවකි.
- ගොවි නියාමකවරුන් අකාර්යක්ෂම ලෙස කටයුතු කරන හෙයින් තොරතුරු නිසි ආකාරයෙන් ගමට නොයන බව නිගමනය කල හැකිය.

කෘෂිකර්මාන්තයේ දියුණුවට ගොවි ජනතාවට අත්‍යවශ්‍ය වුවත් ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළ සතුටුදායක මට්ටමක නැත.

## යෝජනා

රටක දියුණුව සඳහා නිසි ආකාරයෙන් ක්‍රියාත්මක වන තොරතුරු සන්නිවේදන පද්ධතියත් තිබිය යුතුයි. විශේෂයෙන් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දී කාර්යක්ෂම තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක වීම වැදගත් ය.

- රජය විසින් ක්‍රියාත්මක වන සියලුම කෘෂිකාර්මික ප්‍රතිපත්ති ග්‍රාමීය ජනයා වෙත සන්නිවේදනය සඳහා වැඩ සටහන් සකස් කිරීම. විශේෂයෙන්ම යම් ප්‍රදේශයකට යොදන කෘෂිකාර්මික නිලධාරීයා එම ප්‍රදේශයේම අයෙක් වීම වැදගත් වේ.
- ක්ෂේත්‍රයේ කටයුතු කරන කෘෂි නිලධාරීන් වෙනුවෙන් අඛණ්ඩව දැනුවත් කිරීමේ පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- කෘමිනාශක හා පළිබෝධනාශක වලින් ඇතිවන අහිතකර තත්ත්වයන් සම්බන්ධව ගොවිහු දැනුවත් කිරීම
- රටේ සෑම කෘෂිකාර්මික ප්‍රදේශයකම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මඟින් වසරේ මුල් මාසයේ හෝ ජුනි මාසයේ දී කෘෂිකාර්මික ප්‍රදර්ශන, උපදේශ කඳවුරු පැවැත්වීම.
- මෙවැනි ප්‍රායෝගික වැඩ සටහන් මඟින් ගොවීන්ගේ තොරතුරු අවශ්‍යතා තෘප්තිමත් කළ හැකි ය.
- නව ජල යෝජනා ක්‍රම පිළිබඳ හඳුන්වා දීම.
- කෘමිනාශක හා පළිබෝධනාශක වලින් ඇතිවන අහිතකර තත්ත්වයන් සම්බන්ධව ගොවිහු දැනුවත් කිරීම
- ආරක්ෂාකාරී කෘමිනාශක භාවිතය සම්බන්ධව පුහුණුව හා ආරක්ෂක ඇඳුම් කට්ටල ලබා දීම.
- නව යෝජනා ක්‍රම ඉදිරිපත් කිරීමේ දී නව බෝග වර්ග හෝ වෙනත් කෘෂිකාර්මික ක්‍රම නොව අප රටෙහි සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය ආරක්ෂා වන සහ වැඩි දියුණු වන නව යෝජනා ක්‍රම ඉදිරිපත් කිරීම.
- ප්‍රධාන වශයෙන්ම වියලි දේශගුණය සහිත ප්‍රදේශ සඳහා වී වගාව ප්‍රමුඛ කර ගත් එළවලු ආදී ගොඩ ගොවිතැන, ගස්ලබු, මිරිස්, වතු වගවක් ලෙස පොල් වගාව, කජු, බුලත්, බිම්මල් ආදිය සහ ගෙවතු වගාව සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම.
